# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report
# 2019



ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

# 2019 වසර සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්යසාධන වාර්තාව
# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**වියදම් ශීර්ෂ අංක - 288**

# පටුන

පිටුව

**1.0** ආයතනික ආකෘතිය

**1.1** හැඳින්වීම 1
**1.2** දැක්ම, මෙහෙවර හා අරමුණු 3
**1.3** මූලික කාර්යයන් 4
**1.4** සංවිධාන සටහන 6
**1.5** දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 7

**2.0** ප්‍රගතිය සහ අනාගත දැක්ම 8

**3.0** වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය 9

**4.0** කාර්යසාධන දර්ශක 17

**5.0** තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය (SDG) 19

**6.0** මානව සම්පත් පැතිකඩ 19

**7.0** අනුකූලතා වාර්තාව 22

**8.0** සමාප්තිය 27

**9.0** ඇමුණුම්

**i** සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් මගින් ඉටුකළ කාර්යයන් (පිටු i- xxii)

**ii** ක්ෂේත්‍ර කාර්යාල මගින් ඉටුකළ කාර්යයන් (පිටු i- ix)

**iii** මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් ඉටුකළ කාර්යයන් (පිටු i- vii)

**iv** විගණකාධිපති වාර්තාව (පිටු i- xi)

# 1.0 ආයතනික ආකෘතිය

## 1.1 හැඳින්වීම

වර්ෂ 1800 අගෝස්තු 02දින මෙරට මුල්ම දෙපාර්තමේන්තුව ලෙස ගාල්ලේ දී ආරම්භ කර රජයේ විවිධ අවශ්‍යතාවයන් සඳහා ඉඩම් මැනීම, විවිධ භාවිතයන් සඳහා අවශ්‍ය සිතියම් සැකසීම වැනි කාර්යයන් ඉතා හොඳින් ඉටු කිරීම නිසාම “සංවර්ධනයේ පෙරගමන්කරු” ලෙස හැඳින්වෙන ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව 2019 වසර තුළද ඉලක්ක ගත අරමුණු ඉතා හොඳින් සාක්ෂාත් කරගෙන ඇත.

මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස සැලකෙන, ඉඩමක හිමිකම ලබා දීමේ රජයේ ක්‍රියාමාර්ගය යටතේ මිලියන 1.1ක බිම් කට්ටි බෙදා දීමේ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් එම ක්‍රියාදාමයෙහි ආරම්භක පියවර වන ඉඩම් කට්ටි මැනීම යටතේ බිම් කට්ටි 65,553 ක් මැන අදාළ පිඹුරු පිටපත් 30,920 ක් නිකුත් කර ඇත.

එයට අමතරව අධිවේගී මාර්ග, මහා මාර්ග, දුම්රිය මාර්ග මැනීම, ඉංජිනේරු මැනුම් යටතේ වාරි ව්‍යාපෘති සඳහා මැනුම් කිරීම, වනාන්තර/ රක්ෂිත මැනීම ආදී විවිධ මැනුම් සිදු කර ඇත.

කාලීන අවශ්‍යතාවයන් සඳහා වන මැනුම් කටයුතු ආදී විශේෂ මැනුම් කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන විශේෂ මැනුම් අංශය මගින් අදාළ කාර්යයන් ඉටු කිරීමේදී ඉතා හොඳ ප්‍රගතියක් දක්වා ඇත.

මැනුම් පනත යටතේ පැවරී ඇති බලතල අනුව භූමි තොරතුරු රැස් කිරීම, භූමි තොරතුරු අවශ්‍ය පාර්ශවයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට ගබඩා කිරීම, භූ ලක්ෂණාත්මක සිතියම්/ තේමා සිතියම් හා පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීම සඳහා අවශ්‍ය සිතියම් සැකසීමේ කාර්යයන් ද මෙම වර්ෂය තුළ සිදු කර ඇත.

දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය මගින් මහජනතාවට ඉඩම් තොරතුරු අන්තර්ජාලය මඟින් ලබා ගැනීම හා මහජන මිතුරු සේවාවක් ලබා දීම, ක්ෂෙත්‍ර කාර්යාල වලින් සිදුකරන මැනුම් පසුවිපරම් කිරීම සඳහා පිළියෙළ කරන ලද මැනුම් ඉල්ලීම් දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම, පරිපාලන කටයුතුවලට සහායක සේවාවක් ලෙස මානව සම්පත් තොරතුරු කළමනාකරණ දත්ත ගබඩාව අංකිතව පවත්වා ගෙන යාම හා දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් කළමනාකරණයට අවශ්‍ය දත්ත ගබඩාව අංකිත ආකාරයෙන් පවත්වා ගෙන යාම මැනවින් සිදු කර ඇති අතරම, තොරතුරු ඉක්මනින් හා ක්‍රමවත්ව ලබා ගැනීම සඳහාත් තොරතුරු තාක්ෂණය නිරන්තරයෙන් යොදාගන්නා ලද අතර අන්තර්ජාල සම්බන්ධතා හා විද්‍යුත් තැපැල වැනි දියුණු සන්නිවේදන ක්‍රම ද මේ සඳහා යොදා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කර ඇත.
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ සඳහා පරිගණක ජාල පද්ධතියක් හා අන්තර්ජාල පහසුකම්ද ලබාදී ඇති අතර සියලුම අංකිත දත්ත ගබඩා වල තැන්පත් කර ආරක්ෂිතව තබාගැනීමද ඉටුකර ඇත.
දිස්ත්‍රික් කාර්යාල වල ඇති පැරණි පිඹුරු පරිලෝකනය කර දත්ත ගබඩාවක තැන්පත් කර ඇති අතර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට මැනුම් රාජකාරි සඳහා ඒවා භාවිතා කිරීමට අන්තර්ජාලය හරහා පහසුකම් සලසා ඇත.

එමෙන්ම, දෙපාර්තමේන්තුවේ භූමිතික පාලන ජාල පවත්වාගෙන යාම හා CORS තාක්ෂණය මගින් භූමිතික ලක්ෂ්‍ය නිරීක්ෂණ පහසුකම් සලසාදීමද සිදුකර ඇති අතර, මට්ටම්කරණ ජාලයේ දත්ත රැස්කිරීම සඳහාද වූ ඉලක්ක කරා ළඟාවී ඇත.

දෙපාර්තමේන්තුවේ මැනුම් කටයුතු වඩාත් වේගවත් කිරීම සඳහා බාධාවක් වී පැවති මැනුම් ක්ෂේත්‍ර සහායක හිඟය නව බඳවා ගැනීම් මගින් පියවා ගැනීමට කටයුතු කරන ලද අතර දේශීය හා විදේශීය පාඨමාලා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොමු කිරීමද සිදු කර ඇත.

ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු ජාතික සමගියට අනුබලයක් වන නිවැරදි වූත්, නිශ්චිත වූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම සඳහා කටයුතු කරන දෙපාර්තමේන්තුවේ භූගෝලීය නාම අංශය ද අදාළ ඉලක්කයන් සපුරා ඇත.

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව බිම් සවිය ව්‍යාපෘතිය යටතේ දිවයිනේ පිහිටි සියලුම ඉඩම් මැන කඩඉම් සිතියම් සකස් කිරීම සිදු කර, පෞද්ගලික ඉඩම් හිමියන් සඳහා හිමිකම් සහතික නිකුත් කිරීමට අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති හිමිකම් ලියාපදිංචි කිරීමේ අංශය මගින්, 2019 වර්ෂය තුළ මැනීම් සඳහා ඉලක්ක ගත කළ ඉඩම් කැබලි 64,800ක ඉලක්කය 144%ක ප්‍රගතියක් පෙන්නුම් කරමින් ඉඩම් කැබලි 93,308ක් මැනීම් කර ඇත.

දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් සංවර්ධනය කරමින් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කීපයක් අලුතින් ඉදි කිරීම හා පවතින කාර්යාලවල අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කිරීම් සිදු කර ඇති අතර, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්හට වෙන් කර ගැනීම සඳහා වැඩි අවස්ථාවක් ලබා දෙමින් පවත්වාගෙන යනු ලබන සංචාරක බංගලා/ නිවාඩු නිකේතනවල තත්ත්වය ඉහළ නැංවීමද සිදු කර ඇත.

පැරණි හා නවීන ඉඩම් මැනුම් තාක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව සඳහා පහසුකම් ඇති සහ, ඒ සඳහා කැපවී සිටින රජය සතු එකම ආයතනය වශයෙන්, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු ආයතනය ලෙස ක්‍රියාත්මක වෙමින් 2019 වසර සඳහා සිය කාර්ය ඉලක්කයන් ඉටු කර ඇත. මැනුම් හා සිතියම්කරණය පිළිබඳ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු අධ්‍යාපනයක් හා අත්දැකීමක් ලබා දීමෙන් ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පූර්ණ අධ්‍යයන හැකියාව සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් සිය වාර්ෂික මෙහෙවර ක්‍රියාත්මක කර ඇත.

දෙපාර්තමේන්තුවේ මැනුම් කටයුතු සඳහාම පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල අතර ඵලදායිතා තරඟයක් පවත්වා නිලධාරීන්ගේ ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇති අතර එම තරඟයේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග පිරිනැමීමද සිදු කර ඇත.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමඟ සහභාගී විය හැකි වන පරිදි අලුත් අවුරුදු උත්සවය පැවැත්වීම, වෙසක් උත්සවය වෙනුවෙන් සීල ව්‍යාපාරයක් පැවැත්වීම, නවරාත්‍රී පූජාව පැවැත්වීම, දෙපාර්තමේන්තුවේ සංගීත කවයේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයෙන් විකාශය වන සේවක සංග්‍රහය වැඩසටහන යටතේ ගී ගැයීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවස්ථාවක් ලබා දීම වැනි සුබ සාධක කටයුතුද සමාලෝචිත වර්ෂය තුළ සිදු කර ඇත.

### 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

**ඉඩම් තොරතුරු සැපයීමේ සඳා ප්‍රමුඛයා වීම**

**මෙහෙවර**

**වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම**

## අරමුණු

කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ දියතලාවේ මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනයෙන් සමන්විත දිවයින පුරා විසිරුණු කාර්යාල ජාලයක් මගින් දෙපාර්තමේන්තුවේ සේවාව පොදු මහජනයා වෙත ලබා දීමට කටයුතු සලසා ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුළ මෙම කාර්යාල වල ක්‍රියාකාරීත්වය පහත සඳහන් අරමුණු කරා ඉලක්ක කරන ලදී.

- මැනුම් පුහුණු සහ මැනුම් සහ සිතියම්ගත කිරීමේ වාර්ෂික වැඩ සටහන සම්පූර්ණ කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම්
- වර්ෂය තුළ නිම කිරීමට බලාපොරොත්තු වූ වැඩ සටහන් සඳහා අවශ්‍ය වූ නිශ්චල සහ චංචල සම්පත් ගොඩනගා පවත්වා ගෙන යාම
- ලබාදෙන ලද රජයේ අරමුදල් වර්ෂය තුළ නිම කළ යුතුව තිබූ ඒ ඒ පරමාර්ථයන් සඳහා යෙදවීම
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විනය පවත්වා ගෙන යාම සහ සුභ සාධනය පිළිබඳ කටයුතු කිරීම
- මැනුම් වෘත්තියේ ප්‍රමිතීන් පාලනය හා පවත්වාගෙන යාම

## 1.3 මූලික කාර්යයන්

- භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය හඳුන්වා දෙමින් ඉහළ නිරවද්‍යතාවයකින් මැනුම් කිරීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය මගින් ශ්‍රී ලංකා සන්තතික මෙහෙයුම් පාලන පද්ධති (SLCORS) ජාලය පිහිටුවීම තුළින් භූමිතික අවශ්‍යතා සපුරා ගැනීම පහසු කිරීම
- අධිවේගී මාර්ග, මාර්ග පුළුල් කිරීම, ගුවන් තොටුපලවල්, වරායවල් ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපෘති, බල ශක්ති ව්‍යාපෘති වැනි අතිවිශාල සංවර්ධන යෝජනා ක්‍රම සඳහා මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් මැන පිඹුරුපත් සකස් කිරීම
- ඉ.සං.ආ.පනත යටතේ මැනුම් කර දීමනා පත්‍ර ලබා දීමට රේඛා චිත්‍ර නිකුත් කිරීමේ කටයුතු සඳහා ඉඩම් කැබලි මිලියන 1.1 ක රජයේ ඉඩම් මහජනතාව වෙත ලබා දීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් විවිධ අවශ්‍යතා යටතේ ලැබෙන මැනුම් ඉල්ලීම් අනුව මැනුම් සිදු කර අදාළ පිඹුරුපත් ඉදිරිපත් කිරීම, සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා මැනුම් සේවා සැපයීම හා ඒවායේ පිටපත් අදාළ ආයතන වෙත ලබා දීම
- අධිකරණ අවශ්‍යතා අනුව උසාවි කොමිෂන් මැනුම් සිදු කිරීම, අදාළ අනුරේඛණ උසාවි වෙත ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී අධිකරණයේ පෙනී සිට පිළිතුරු සැපයීම
- 1952-2014 කාලය තුළ දෙපාර්තමේන්තුව මගින් ලබා ගත් ගුවන් ඡායාරූප සිතියම්කරණය, සංවර්ධන සැලසුම්, පාරිභෝගික අවශ්‍යතා ආදිය සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි නිකුත් කිරීම
- ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා ඡායාරූප භාවිත කර මුළු රටම ආවරණය වන පරිදි භූගෝලීය දත්ත පද්ධතියක් සකසා යථාවත් කිරීම
- දෙපාර්තමේන්තුව ආරම්භයේ පැවති අඟලට සැතපුමේ භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව ප්‍රතිස්ථාපනය කරමින් 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, යාවත්කාලීන

කිරීම, දිවයින සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, තේමා හා විශේෂ කාර්යයන් සඳහා වූ සිතියම් සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම

- භාෂාත්‍රයෙන්ම ජාතික සිතියම් සංග්‍රහය සැකසීම
- මුළු රටම ආවරණය වන පරිදි ක්‍රමානුකූලව ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම
- මැනුම් වෘත්තිය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම
- දෙපාර්තමේන්තුව යටතේ ඇති මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම මගින් දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව නිලධාරීන් පුහුණු කිරීම හා අනෙකුත් ආයතනවල ඉල්ලීම් මත නිලධාරීන් සඳහා ප්‍රායෝගික පුහුණු පාඨමාලා පැවැත්වීම
- රාජ්‍ය ආයතනයන් සඳහා මැනුම් කටයුතු පිළිබඳ උපදෙස් හා සේවා සැපයීම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අදාළ විභාග පැවැත්වීම
- ඉඩම් මැනීමට හා සිතියම්කරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පර්යේෂණ පැවැත්වීම
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි මිනින්දෝරුවන්ගේ කඩඉම් මැනුම්කරණය පිළිබඳ මිනින්දෝරුවරයාගේ නිපුණතාව සම්බන්ධයෙන් ප්‍රතීතන සහතික නිකුත් කිරීම
- ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සකස් කිරීම
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව දිවයිනේ පිහිටි සියලුම රජයේ හා පෞද්ගලික ඉඩම් මුදල් අය කිරීමකින් තොරව මැනීම් කර කඩඉම් සිතියම් සකස් කර හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට සකසන ලද පැරණි පිඹුරු සුරක්ෂිතව තබා ගැනීම සහ මහජන අවශ්‍යතා සඳහා තමාගේ ඉඩමේ හිමිකම් පිඹුරුපතක් කඩිනමින් හා පහසුවෙන් ලබා ගැනීමේ පහසුකම් සැපයීම
- අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය හා ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට ලබා දීම
- ශ්‍රී ලාංකීය ජනතාවගේ උරුමය හා බැඳුණ ජාතික සමගියට අනුබලයක් වන නිවැරදිවූත්, නිශ්චිතවූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම
- ආලෝක අනාවරණ හා පරාස තාක්ෂණය (LiDAR) ශ්‍රී ලංකාවට හඳුන්වා දීම හා එමගින් අවශ්‍ය දත්ත ලබා ගැනීමේ පහසුකම් සලසා දීම
- විශ්වවිද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා විවිධ අංග අධ්‍යයනය සඳහා අධ්‍යයන සැසි පැවැත්වීම

**1.4 සංවිධාන ව්‍යුහය**

## පරිපාලන ව්‍යුහය මිනින්දෝරු දෙපාර්තමේන්තුව - 2019




| | | | |
|---|---|---|---|
| අති.ස.ජ. | - අතිරේක සර්වේයර් ජනරාල් | ප.නි. | - පරිපාලන නිලධාරි |
| ජ්‍යෙ.නි.ස.ජ. | - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | සම්.කළ. | - සම්පත් කළමනාකරණ |
| පළාත් ස.ජ. | - පළාත් සර්වේයර් ජනරාල් | ලේ.ක. හා වෘ.ප්‍ර. | - ලේඛණ කළමනාකරණ හා වෘත්තිය ප්‍රමිතීන් |
| නි.ස.ජ. | - නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | ගොඩ. හා උප. | - ගොඩනැගිලි හා උපකරණ |
| ජ්‍යෙ.මි.අ. | - ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි | ප්‍රසම්. හා සැප. | - ප්‍රසම්පාදන හා සැපයීම් |
| මි.අ. | - මිනින්දෝරු අධිකාරි | පර්. හා සං. | - පර්යේෂණ හා සංවර්ධන |
| නි. අධ්‍යක්ෂ | - නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඉ.තො.ප. | - ඉඩම් තොරතුරු පද්ධති |
| ස. අධ්‍යක්ෂ | - සහකාර අධ්‍යක්ෂ | භූ.තො.ප. | - භූ තොරතුරු පද්ධති |
| කා.ප.නි. | - කාර්මික හා පරිපාලන නිලධාරි | ජා.අ.ද.ය.ව්‍යු. | - ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය |
| ගුවන් | - ගුවන් මැනුම් | ඡා.කා.නි. | - ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරි |
| හි.ලි. | - හිමිකම් ලියාපදිංචි කිරීම | පි.ව.කා.නි. | - පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරි |
| මැ.සි.ආ. | - මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය | ඡු.ඡා.කා.නි. | - ගුවන් ඡායාරූප තාක්ෂණ නිලධාරි |
| ප්‍රා.මි.කා. | - ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාල | ලි.මු.කා.නි. | - ලිතෝ මුද්‍රණ තාක්ෂණ නිලධාරි |
| තො.තා. | - තොරතුරු තාක්ෂණ | තො.කා.නි. | - තොරතුරු තාක්ෂණ නිලධාරි |
| කළ.සං.හා පු.ඒ. | - කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | තො.කා.ස. | - තොරතුරු තාක්ෂණ සහකාර |
| වි.මැ. හා තත්.පා. | - විශේෂ මැනුම් හා තත්ත්ව පාලන | මැ.උ.කා.ශි. | - මැනුම් උපකරණ කාර්මික ශිල්පි |
| සි.කා.නි. | - සිතියම් තාක්ෂණ නිලධාරි | සං. නි. | - සංවර්ධන නිලධාරි |
| දූ.ග්‍ර.කා.නි. | - දූරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි | ක.සේ.නි. | - කළමනාකරණ සේවා නිලධාරි |

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

මිනින්දෝරු දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 03කින් සමන්විතය.

1. සර්වේයර් ජනරාල් කාර්යාලය

2. ක්ෂේත්‍ර කාර්යාල

3. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය

## 01. සර්වේයර් ජනරාල් කාර්යාලය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ මැනුම්කරණය සහ සිතියම්කරණයයි. මැනුම් කිරීම ක්ෂේත්‍ර රාජකාරියක් ලෙස දිවයින පුරා ක්‍රියාත්මක වන අතර එහි පූර්ණ අධීක්ෂණය සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයෙනි. සිතියම්කරණය යටතේ භූ ලක්ෂණාත්මක සිතියම් සැකසීම, තේමා සිතියම් සැකසීම, පාරිභෝගික අවශ්‍යතාවයන් අනුව සිතියම් සැකසීම ප්‍රධාන කාර්යාලයේ සිදු කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය වන භූමි තොරතුරු ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ඡායාරූප ආදිය භාවිතයෙන් රැස් කිරීම හා එම දත්ත අවශ්‍යතාවයන් අනුව නිකුත් කිරීම සඳහා ගබඩා කිරීම ද ප්‍රධාන කාර්යාලයේ ඇති සිතියම්කරණයට සම්බන්ධ ශාඛාවල සිදු කරනු ලබන කාර්යයන් වේ.

දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් කළමනාකරණය, දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම ආදී කාර්යයන් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ආයතන,ගබඩා,ගොඩනැගිලි හා උපකරණ යන අංශ මගින් සිදු කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය හා ක්ෂේත්‍ර කාර්යාලය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා අක්මුදල් ලබා දීමද සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය මගිනි. ඊට අමතරව අංකිත දත්ත පවත්වාගෙන යාම මානව, භෞතික සම්පත් කළමනාකරණයට අවශ්‍ය දත්ත පද්ධති පවත්වාගෙන යාම,මැනුම් ඉල්ලීම් දත්ත පද්ධතිය පවත්වාගෙන යාම ආදී සියලුම තොරතුරු තාක්ෂණ සන්නිවේදන කටයුතු හා වෙබ් අඩවි පවත්වාගෙන යාමද සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය ඇතුළු අනෙකුත් තාක්ෂණ අංශයන් සම්බන්ධීකරණයෙනි. දෙපාර්තමේන්තුවේ සියලුම නීති කටයුතු සඳහා ක්‍රියා කිරීම නීති අංශය මගින් ඉටු කරන අතර විශේෂ මැනුම් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ විශේෂ මැනුම් ඒකකයක් ස්ථාපිත කර ඇත. භූමිතික අංශය මගින් සියලුම තිරස් හා සිරස් පාලන ලක්ෂයන් ස්ථාපිත කිරීම හා පාලන ජාල නඩත්තු කිරීම අධීක්ෂණයද සිදු කරයි.

කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර *ඇමුණුම i* බලන්න.

## 02. ක්ෂේත්‍ර කාර්යාල

රජයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් මැනීම, මහජනතාවට ඉඩම් ඔප්පු ලබා දීම සඳහා අවශ්‍ය වන මූලික කාර්යය වශයෙන් ඉඩම් මැනීම, ඉඩම් හිමිකම් නිරවුල් කිරීම සඳහා "බිම් සවිය" ව්‍යාපෘතිය යටතේ ඉඩම් මැනීම, ආරවුල් පවතින අවස්ථාවලදී උසාවි මගින් ලබාදෙන නියෝග මත වැනි විවිධ මැනුම් අවශ්‍යතාවයන් ඉටු කර දීම සඳහා පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09ක්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 25ක්, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 89 ක් දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලැබේ.

කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර *ඇමුණුම ii* බලන්න.

## 03. මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය-දියතලාව

පැරණි හා නවීන ඉඩම් මැනුම් තාක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව සඳහා පහසුකම් ඇති, ඒ සඳහා කැපවී සිටින රජය සතු එකම ආයතනය ලෙස ක්‍රියා කරමින්, මැනුම් හා සිතියම්කරණය පිළිබඳ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු අධ්‍යාපනය හා අත්දැකීම් ලබාදීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම ආයතනය, 1969 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලදුව, 1990.07.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත යටතේ පිළිගෙන ඇත.

ආයතනික දැක්ම ලෙස ආසියානු කලාපයේ භූ තොරතුරු පිළිබඳ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වීම පෙරදැරි කොට ක්‍රියාත්මක වන මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් මේ වන විට මැනුම් විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධි පාඨමාලාව සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා, සිතියම් විද්‍යාව, දූරස්ථ ග්‍රහණ තාක්ෂණය, ගුවන් ඡායාරේඛණමිතිය, පිඹුරු වර්ණ මුද්‍රණ තාක්ෂණය, ලිතෝ මුද්‍රණ තාක්ෂණය පිළිබඳ දෑවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා හා මැනුම් ක්ෂේත්‍ර සහයක වරුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම (NVQ මට්ටම 2,3) යන පාඨමාලා පවත්වනු ලැබේ.

එමෙන්ම, දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හැකියාවන් හා දැනුම වැඩිදියුණු කරලීමට අවශ්‍ය වෘත්තීය සංවර්ධන පුහුණු වැඩ සටහන් ද අඛණ්ඩව වාර්ෂිකව මෙහෙයවනු ලබන්නේ මෙම ආයතනය මගිනි .

මෙයට අමතරව අනෙකුත් රජයේ සහ අර්ධ රාජ්‍ය සංවිධානවල ඉල්ලීම් පරිදි, තාක්ෂණික කාර්ය මණ්ඩල සඳහා සහ මැනුම් හා සම්බන්ධ දේශීය විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල විද්‍යායතනවල සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා මැනුම් කඳවුරු නමින් හැඳින්වෙන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් මෙහෙයවීම ද මෙම ආයතනය මඟින් සිදුකරනු ලබයි.

**කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර** *ඇමුණුම iii* **බලන්න.**

# 2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම

## විශේෂ කාර්යයන්

### ඵලදායීතා වැඩසටහන මිනින්දෝරු දෙපාර්තමේන්තුව තුළ සක්‍රීයව ක්‍රියාත්මක කිරීම

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ මට්ටමකට ළඟාවීමට ක්ෂේත්‍ර කාර්යාලවල සක්‍රීය දායකත්වය ලබා ගැනීම අනිවාර්ය සාධකයක් වන බැවින් ඒ සඳහා සේවක තෘප්තිමත්භාවය වැඩිදියුණු කර කණ්ඩායම් අතර සුහදතාවය වර්ධනය කර මහජන මිතුරු හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සියලුම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල අතර තරඟයක් 2019 වසරේදී පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා ප්‍රාදේශීය මිනින්දෝරු /භූමිතික කාර්යාල 83 ක් සහභාගී වූ අතර එයින් ජයග්‍රහණය කල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල /භූමිතික කාර්යාල සඳහා ත්‍යාග පිරිනමා ඇත.

## අභියෝග

දිවයිනම ආවරණය වන පරිදි සියලුම බිම් කැබලි ඒකක වශයෙන් මැනුම් කර දත්ත පද්ධතියට ඇතුළත් කිරීම

## අනාගත දැක්ම

අවම කාලයකින් මහජනතාවගේ අවශ්‍යතා ඉටුකර දීම සඳහා ක්‍රමවේද සැකසීම

# 3.0 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

රු.

| අයවැය **2019** | | සටහන | තත්‍ය **2019** | තත්‍ය **2018** | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | 608,799,198 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| 420,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 432,574,895 | 608,799,198 | |
| | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 432,574,895 | 608,799,198 | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,327,805,057 | 3,310,298,068 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 83,925,709 | 85,386,809 | ඒසීඒ -4 |
| 122,000,000 | අත්තිකාරම් ගිණුම් | | 156,284,512 | 159,100,318 | ඒසීඒ - 5/5(ඒ) |
| - | වෙනත් ලැබීම් | | 186,865,117 | 36,608,792 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | 3,754,880,395 | 3,591,393,987 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම්නොවන ලැබීම් ඇ=(අ) + (ආ)** | | 4,187,455,290 | 4,200,193,185 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| | වැටුප්, වේතන සහ | | - | - | |
| 3,329,750,000 | අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 3,241,701,748 | 3,046,226,915 | |
| 455,550,00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 429,778,459 | 417,675,424 | ඒසීඒ -2(ii) |
| | සහනාධාර,ප්‍රදාන සහ | | | | |
| 20,950,000 | මාරු කිරීම් | 7 | 20,149,194 | 19,545,636 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| | වෙනත් පුනරාවර්තන | | | | |
| 100,000 | වියදම් | 9 | 40,715 | 94,705 | |
| 3,806,350,000 | **මුළු පුනරාවර්තන වියදම්(ඇ)** | | 3,691,670,116 | 3,483,542,680 | |
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් | | | | |
| | පුනරුත්ථාපනය හා | | | | |
| 83,000,000 | වැඩිදියුණු කිරීම් | 10 | 59,933,591 | 72,391,980 | |
| | මූලධන වත්කම් අත්පත් | | | | |
| 237,100,000 | කර ගැනීම් | 11 | 96,281,512 | 135,304,836 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ -2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් | | | | |
| - | කර ගැනීම | 13 | - | - | |
| 3,100,000 | හැකියා වර්ධනය | 14 | 2,195,218 | 1,586,313 | |
| 10,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 5,921,093 | 16,738,850 | |
| 333,200,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **164,331,414** | **226,021,979** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම (ඊ)** | | **206,720,626** | **235,548,383** | |
| | **තැන්පතු ගෙවීම්** | | 72,703,236 | 77,828,762 | ඒසීඒ -4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 134,017,390 | 157,719,621 | ඒසීඒ -5/5(ඒ) |
| | **මුළු වියදම් උ=(ඇ+ඉ+ඊ)** | | 4,062,722,156 | 3,945,113,042 | |
| | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ=(ඈ-උ)** | | **124,733,134** | **255,080,143** | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-3

### 2019 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සතය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 7,873,300,145 | 7,703,657,753 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 351,859,562 | 374,126,685 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 255,080,143 |
| මුළු වත්කම් | | 8,225,159,707 | 8,332,864,581 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 331,550,048 | 351,809,990 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 7,873,300,145 | 7,703,657,753 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 11,094,222 | 22,316,695 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 9,215,292 | 255,080,143 |
| මුළු වගකීම් | | 8,225,159,707 | 8,332,864,581 |

පිටු අංක…1.සිට …36… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක …37… සිට …55… දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| ……………………… | ……………… | ……………………………… |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2020.02.26 |
| දිනය : 2020.02 | දිනය : 2020.02.26 | |

ආර්. ඒ. ඒ. කේ. රණවක
ලේකම්
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

A.L. Shyamalie Chitraleka Perera
Surveyor General
Surveyor General's Office
Colombo 05.

ඩී. ඩී. සචින්ද කුරේ.
අධ්‍යක්ෂ (මුදල්).
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## 3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සත්‍ය<br>2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු,අධිභාර,දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 432,574,895 | 3,955,706,058 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | 186,865,117 | |
| අග්‍රිම ලැබීම් | 3,327,805,057 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **3,947,245,069** | **3,955,706,058** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 3,668,306,387 | 3,463,997,044 |
| සහනාධාර සහ මාරු කිරීම් | 20,149,194 | 19,545,636 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 165,077,519 | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 186,935 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,853,720,035** | **3,483,542,680** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)** | **93,525,034** | **472,163,378** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 156,284,512 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **156,284,512** | **-** |
| <u>අඩුකළා: මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 95,354,391 | 226,021,979 |
| අත්තිකාරම් ගෙවීම් | 134,017,390 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **229,371,781** | **226,021,979** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(73,087,269)** | **(226,021,979)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **20,437,765** | **246,141,399** |

| | | |
|---|---|---|
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 83,925,709 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **83,925,709** | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීයණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 72,703,236 | 8,938,744 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **72,703,236** | **8,938,744** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **11,222,473** | **(8,938,744)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)** | 9,215,292 | 255,080,143 |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.5 මූල්‍ය වාර්තා සඳහා සටහන්

නොමැත.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතුකරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රථම | අවසාන | ගණන (රු.) | අවසාන ආදායම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| 200.302.00 | මැනුම්පති ආදායම | 420,000.00 | 420,000.00 | 432,000.00 | 102% |

## 3.7 ප්‍රතිපාදන භාවිතයේ කාර්යසාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | | | | | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | | | | | ප්‍රථම | අවසාන | | |
| 288 | 1 | 1 | 1001 | වැටුප් හා වේතන | 125,300,000.00 | 125,300,000.00 | 124,507,801.63 | 99.37 |
| 288 | 1 | 1 | 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 1,700,000.00 | 1,700,000.00 | 1,689,389.89 | 99.38 |
| 288 | 1 | 1 | 1003 | වෙනත් දීමනා | 44,000,000.00 | 44,000,000.00 | 39,324,392.95 | 89.37 |
| 288 | 1 | 1 | 1101 | දේශීය | 900,000.00 | 900,000.00 | 899,980.82 | 100 |
| 288 | 1 | 1 | 1102 | විදේශීය | 3,000,000.00 | 3,000,000.00 | 2,756,001.94 | 91.87 |
| 288 | 1 | 1 | 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | 2,600,000.00 | 2,600,000.00 | 2,566,837.28 | 98.72 |
| 288 | 1 | 1 | 1202 | ඉන්ධන | 5,000,000.00 | 5,000,000.00 | 4,837,220.88 | 96.74 |
| 288 | 1 | 1 | 1203 | ආහාර සහ නිල ඇඳුම් | 200,000.00 | 200,000.00 | 148,000.00 | 74 |
| 288 | 1 | 1 | 1205 | වෙනත් | 500,000.00 | 500,000.00 | 467,504.61 | 93.5 |
| 288 | 1 | 1 | 1301 | වාහන | 4,000,000.00 | 4,000,000.00 | 2,991,898.10 | 74.8 |
| 288 | 1 | 1 | 1302 | Plant, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 600,000.00 | 600,000.00 | 517,061.17 | 86.18 |
| 288 | 1 | 1 | 1401 | ප්‍රවාහන | 8,000,000.00 | 8,000,000.00 | 7,800,000.00 | 97.5 |
| 288 | 1 | 1 | 1402 | තැපැල් සහ සන්නිවේදන | 5,300,000.00 | 5,300,000.00 | 5,084,779.60 | 95.94 |
| 288 | 1 | 1 | 1403 | විදුලිය සහ ජලය | 19,600,000.00 | 19,600,000.00 | 17,293,615.79 | 88.23 |
| 288 | 1 | 1 | 1404 | කුලී සහ දේශීය බදු | 5,450,000.00 | 5,450,000.00 | 5,308,332.90 | 97.4 |
| 288 | 1 | 1 | 1409 | වෙනත් | 14,000,000.00 | 14,000,000.00 | 13,051,852.58 | 93.23 |
| 288 | 1 | 1 | 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 20,700,000.00 | 20,700,000.00 | 20,008,627.07 | 96.66 |
| 288 | 1 | 1 | 1703 | රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000.00 | 100,000.00 | 40,715.00 | 40.72 |
| 288 | 2 | 2 | 1001 | වැටුප් හා වේතන | 2,123,000,000.00 | 2,123,000,000.00 | 2,091,438,014.67 | 98.51 |
| 288 | 2 | 2 | 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 9,250,000.00 | 9,250,000.00 | 8,242,524.40 | 89.11 |
| 288 | 2 | 2 | 1003 | වෙනත් දීමනා | 936,500,000.00 | 936,500,000.00 | 886,995,045.12 | 94.71 |
| 288 | 2 | 2 | 1101 | දේශීය | 125,000,000.00 | 125,000,000.00 | 120,435,718.05 | 96.35 |
| 288 | 2 | 2 | 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | 10,500,000.00 | 10,500,000.00 | 9,514,365.16 | 90.61 |
| 288 | 2 | 2 | 1202 | ඉන්ධන | 36,000,000.00 | 36,000,000.00 | 34,566,343.09 | 96.02 |
| 288 | 2 | 2 | 1203 | ආහාර සහ නිල ඇඳුම් | 1,150,000.00 | 1,150,000.00 | 1,136,000.00 | 98.78 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 288 | 2 | 2 | 1205 | සිතියම්කරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, මායිම් ගල් සහ වෙනත් | 13,800,000.00 | 13,800,000.00 | 13,122,346.18 | 95.09 |
| 288 | 2 | 2 | 1301 | වාහන | 25,500,000.00 | 25,500,000.00 | 23,517,823.51 | 92.23 |
| 288 | 2 | 2 | 1302 | Plant, ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | 1,000,000.00 | 1,000,000.00 | 949,231.58 | 94.92 |
| 288 | 2 | 2 | 1303 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 1,500,000.00 | 1,500,000.00 | 1,456,361.75 | 97.09 |
| 288 | 2 | 2 | 1401 | ප්‍රවාහන | 33,000,000.00 | 33,000,000.00 | 30,281,280.61 | 91.76 |
| 288 | 2 | 2 | 1402 | තැපැල් සහ සන්නිවේදන | 33,500,000.00 | 33,500,000.00 | 33,320,164.36 | 99.46 |
| 288 | 2 | 2 | 1403 | විදුලිය සහ ජලය | 8,700,000.00 | 8,700,000.00 | 8,287,345.84 | 95.26 |
| 288 | 2 | 2 | 1404 | ගෙවල් කුලීදීමනා | 62,550,000.00 | 62,550,000.00 | 59,324,051.54 | 94.84 |
| 288 | 2 | 2 | 1408 | මෙහෙයුම් කල්බදු යටතේ ගන්නා වාහන සඳහා කල්බදු කුලිය | 12,500,000.00 | 12,500,000.00 | 10,335,120.00 | 82.68 |
| 288 | 2 | 2 | 1409 | වෙනත් | 6,600,000.00 | 6,600,000.00 | 6,347,720.95 | 96.18 |
| 288 | 2 | 2 | 1505 | ග්‍රාහක සහ දායක ගාස්තු | 250,000.00 | 250,000.00 | 140,566.95 | 56.23 |
| 288 | 2 | 3 | 1001 | වැටුප් හා වේතන | 65,000,000.00 | 65,000,000.00 | 65,000,000.00 | 100 |
| 288 | 2 | 3 | 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 550,000.00 | 550,000.00 | 549,594.79 | 99.93 |
| 288 | 2 | 3 | 1003 | ජීවන වියදම් දීමනා | 24,450,000.00 | 24,450,000.00 | 23,954,984.77 | 97.98 |
| 288 | 2 | 3 | 1101 | දේශීය | 850,000.00 | 850,000.00 | 484,198.00 | 56.96 |
| 288 | 2 | 3 | 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | 1,000,000.00 | 1,000,000.00 | 782,664.98 | 78.27 |
| 288 | 2 | 3 | 1202 | ඉන්ධන | 1,800,000.00 | 1,800,000.00 | 1,667,847.45 | 92.66 |
| 288 | 2 | 3 | 1203 | ආහාර සහ නිල ඇඳුම් | 50,000.00 | 50,000.00 | 50,000.00 | 100 |
| 288 | 2 | 3 | 1301 | වාහන | 1,000,000.00 | 1,000,000.00 | 713,232.37 | 71.32 |
| 288 | 2 | 3 | 1302 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 100,000.00 | 100,000.00 | 100,000.00 | 100 |
| 288 | 2 | 3 | 1303 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 200,000.00 | 200,000.00 | 200,000.00 | 100 |
| 288 | 2 | 3 | 1401 | ප්‍රවාහන | 1,800,000.00 | 1,800,000.00 | 1,800,000.00 | 100 |
| 288 | 2 | 3 | 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,200,000.00 | 1,200,000.00 | 1,099,455.11 | 91.62 |
| 288 | 2 | 3 | 1403 | විදුලිය සහ ජලය | 1,500,000.00 | 1,500,000.00 | 1,417,366.18 | 94.49 |
| 288 | 2 | 3 | 1409 | වෙනත් | 5,600,000.00 | 5,600,000.00 | 5,146,736.45 | 91.91 |
| ප්‍රාග්ධන | | | | | | | | |
| 288 | 1 | 1 | 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 15,000,000.00 | 15,000,000.00 | 6,947,159.26 | 46.31 |
| 288 | 1 | 1 | 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 1,200,000.00 | 1,200,000.00 | 912,882.36 | 76.07 |
| 288 | 1 | 1 | 2003 | වාහන | 2,200,000.00 | 2,200,000.00 | 146,117.08 | 6.64 |
| 288 | 1 | 1 | 2102 | ලීබඩු සහ කාර්යාලයීය උපකරණ | 3,400,000.00 | 3,400,000.00 | 3,311,178.67 | 97.39 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 288 | 1 | 1 | 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 14,200,000.00 | 14,200,000.00 | 11,391,929.00 | 80.22 |
| 288 | 1 | 1 | 2104 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 40,000,000.00 | 40,000,000.00 | 40,000,000.00 | 100 |
| 288 | 1 | 1 | 2401 | පුහුණු සහ ධාරිතා වර්ධනය | 1,000,000.00 | 1,000,000.00 | 782,070.21 | 78.21 |
| 288 | 2 | 2 | 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 26,000,000.00 | 26,000,000.00 | 23,524,422.07 | 90.48 |
| 288 | 2 | 2 | 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 12,500,000.00 | 12,500,000.00 | 10,043,108.22 | 80.34 |
| 288 | 2 | 2 | 2003 | වාහන | 22,500,000.00 | 22,500,000.00 | 17,166,487.05 | 76.3 |
| 288 | 2 | 2 | 2102 | ලීබඩු සහ කාර්යාලයීය උපකරණ | 8,000,000.00 | 8,000,000.00 | 3,995,998.27 | 49.95 |
| 288 | 2 | 2 | 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 120,000,000.00 | 120,000,000.00 | 11,343,194.49 | 9.45 |
| 288 | 2 | 2 | 2104 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 50,000,000.00 | 50,000,000.00 | 24,788,830.38 | 49.58 |
| 288 | 2 | 2 | 2401 | පුහුණු සහ ධාරිතා වර්ධනය | 1,000,000.00 | 1,000,000.00 | 830,143.73 | 83.01 |
| 288 | 2 | 2 | 2509 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 10,000,000.00 | 10,000,000.00 | 5,921,092.65 | 59.21 |
| 288 | 2 | 3 | 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 1,500,000.00 | 1,500,000.00 | 0 | - |
| 288 | 2 | 3 | 2002 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 800,000.00 | 800,000.00 | 518,534.49 | 64.82 |
| 288 | 2 | 3 | 2003 | වාහන | 1,300,000.00 | 1,300,000.00 | 674,881.35 | 51.91 |
| 288 | 2 | 3 | 2103 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 1,500,000.00 | 1,500,000.00 | 1,450,380.59 | 96.69 |
| 288 | 2 | 3 | 2401 | පුහුණු සහ ධාරිතා වර්ධනය | 1,100,000.00 | 1,100,000.00 | 583,004.04 | 53 |
| | | | | | **4,139,550,000.00** | | **3,856,001,529.98** | |

## 3.7 මු.රෙ. 208 අනුව මෙම දෙපාර්තමේන්තුව සඳහා වෙනත් අමාත්‍යාංශයක /දෙපාර්තමේන්තුවක නියෝජිතයෙකු ලෙස ප්‍රතිපාදන ලබාදීම

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රථම | අවසන් | | |
| **1.** | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (311) | මැනුම් ගාස්තු | 310,500.00 | 310,500.00 | 310,500.00 | 100 |
| **2.** | සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය (159) | මැනුම් ගාස්තු | 78,579.50 | 78,579.50 | 78,579.50 | 100 |
| 3. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව (224) | සිතියම් විකිණීම | 1,780,000.00 | 1,780,000.00 | 1,780,000.00 | 100 |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වර්ගීකරණයේ කාර්යසාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය 2019.12.31දිනට | මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය 2019.12.31දිනට | ගිණුම් ගත කළයුතුව පවතින | ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 1,222,234,842..92 | 1,222,234,842.92 | - | - |
| 9152 | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 952,143,756.09 | 952,143,756.09 | - | - |
| 9153 | ඉඩම් | 5,689,157,500.00 | 5,689,157,500.00 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කරමින් පවතින කටයුතු | 9,764,046.44 | 9,764,046.44 | - | - |
| 9180 | බදු වත්කම් | - | - | - | - |

### 3.9 විගණකාධිපති වාර්තාව

කරුණාකර *ඇමුණුම iv* බලන්න.

## 4.0 කාර්යසාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | **>100%** | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| **මැනුම් කාර්යයන්** | | | | |
| මායිම් ගල් දැමීමේ මැනුම් | √ | | | |
| විවිධ මැනුම් | √ | | | |
| ඉඩම් අත්කර ගැනීමේ මැනුම් | √ | | | |
| ඉංජිනේරු මැනුම් | √ | | | |
| සිතියම්කරණය සඳහා පාලන ලක්ෂ්‍ය පිහිටුවීම | √ | | | |
| උසාවි කොමිෂන් මැනුම් | | √ | | |
| පාලන ලක්ෂ්‍ය පිහිටුවීම | √ | | | |
| විශේෂ මැනුම් | √ | | | |

| | | | | |
|---|---|---|---|---|
| **සිතියම්කරණ කාර්යයන්** | | | | |
| භූලක්ෂණාත්මක සහ තේමා සිතියම් | | √ | | |
| මුද්‍රණ කටයුතු | √ | | | |
| භූගෝලීය දත්ත පද්ධතිය යථාවත් කිරීම සහ සංස්කරණය කිරීම | | √ | | |
| කඩඉම් සිතියම් සඳහා ඉඩම් තොරතුරු පද්ධතිය සැකසීම | √ | | | |
| විකීර්ණ මැනුම් සඳහා ඉඩම් තොරතුරු පද්ධතිය සැකසීම | | √ | | |
| පසුකාලීන මැනුම් යාවත්කාලීන කිරීම | √ | | | |
| දිස්ත්‍රික් කාර්යාල වලින් සකස් කරන දත්ත මගින් ඉඩම් තොරතුරුපද්ධතිය යථාවත් කිරීම සහ පවත්වා ගෙන යාම | √ | | | |
| LiDAR දත්ත භාවිතයෙන් DEM/DSM සැකසීම | √ | | | |
| 10k දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම සඳහා 2D දත්ත රැස් කිරීම | | | √ | |
| පාරිභෝගික ඉල්ලීම් මත ගුවන් ඡායාරූප නැවත මුද්‍රණය | √ | | | |
| 50K භූ ලක්ෂණාත්මක දත්ත ගබඩාව පුනරීක්ෂණය | | | √ | |
| 10k දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම | | √ | | |
| පරිශීලක ඉල්ලුම සඳහා යෙදවුම් | √ | | | |
| **විභාග පැවැත්වීම** | | | √ | |
| **මැනුම් පුහුණුව** | | | | |
| දිගු කාලීන පාඨමාලා | | | | √ |
| කෙටි කාලීන පාඨමාලා | | | √ | |
| **බිම්සවිය ව්‍යාපෘතිය** | | | | |
| හිමිකම් ලියාපදිංචිය සඳහා කැඩැස්තර සිතියම් සැකසීම | √ | | | |

## 5.0 තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය (SDG)

### 5.1 හඳුනාගත් අදාල තිරසාර සංවර්ධන ඉලක්ක

| අභිමතාර්ථය/ අරමුණ | ඉලක්කය | කාර්ය සිද්ධි සාධනයේ දර්ශක | කාර්ය සිද්ධි සාධනයේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% -100% | >100% |
| සංවර්ධනය,ආයෝජනය සහ කෘෂිකාර්මික අරමුණු සඳහා මැනුම් දත්ත පිළියෙළ කිරීම | සංවර්ධන අරමුණු සඳහා ඉඩම් මැනීම සහ දත්ත ගබඩාව පිළියෙළ කිරීම | මනින ලද ප්‍රදේශය සහ කැබලි ගණන | | | | √ |
| අවකාශීය දත්ත විශ්ලේෂණය සඳහා සිතියම් සකස් කිරීම | සංවර්ධනය සඳහා සිතියම් සකස් කිරීම | සිතියම්, දත්ත පද්ධති සංඛ්‍යාව | | | | √ |
| කාර්ය මණ්ඩල නිසි ආකාරයෙන් යොදා ගැනීම සඳහා මැනුම් පුහුණුව | වෘත්තීය සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම | විභාග/ පුහුණු වැඩ සටහන් ගණන | | | | √ |

**5.2** තිරසාර සංවර්ධන උපාය මාර්ග හඳුනාගෙන ඇති අතර, ඒ අනුව මූලික අරමුණු තුනක් යටතේ ඒ සඳහා කටයුතු කිරීමට අපේක්ෂිතය.ඒ අනුව, මැනුම් දත්ත සකස් කිරීම යටතේ 122%ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇති අතර සිතියම් සකස් කිරීම යටතේ 103%ක ප්‍රගතියක් සහ පුහුණු කිරීම් යටතේ103%ක ප්‍රගතියක් ද ලබාගෙන ඇත. මෙහිදි දෙපාර්තමේන්තුව ඉදිරියේ ඇති මූලික අභියෝග වන්නේ භෞතික සම්පත් හිඟකම හා කාලීනව සිදුවන තාක්ෂණ වැඩිදියුණු කිරීම් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් ලබා ගත නොහැකි වීමය.

## 6.0 මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත තනතුරු ගණන | වසර අවසානයේ සිටි සේවක සංඛ්‍යාව | හිඟ / අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1142 | 979 | 163 |
| තෘතීයික | 83 | 42 | 41 |
| ද්විතියික | 1172 | 984 | 188 |
| ප්‍රාථමික | 4890 | 4065 | 825 |
| **එකතුව** | **7287** | **6070** | **1217** |

**6.2** මෙම දෙපාර්තමේන්තුව තාක්ෂණික කටයුතු, සාමාන්‍ය කාර්යාලීය කටයුතු හා එම කාර්යයන් හා බැඳුනු පරිපාලන කටයුතු ඉටු කරන විවිධ මට්ටම් වල නිලධාරීන්ගෙන් සමන්විතය.ඒ අතරින් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ,කාර්මික හා පරිපාලන සේවයේ, මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ, ඒකාබද්ධ සේවයේ සහ සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු සැලකිය යුතු මට්ටමින් දෙපාර්තමේන්තුව තුළ පවතී.එමෙන්ම ප්‍රවාහන නිලධාරියෙකු හා ගොඩනැගිලි පරිපාලකවරයෙකු දෙපාර්තමේන්තුවට අනුයුක්ත නොවීම සහ දෙපාර්තමේන්තුවේ වටිනා සම්පතක් වන පිඹුරු නිසි තත්වයෙන් පවත්වා ගැනීමට අවශ්‍ය සේවය සපයන පිඹුරු අලුත්වැඩියා කරුවන්ගේ හිඟය ආදී කරුණුද දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා සෘණාත්මක බලපෑමක් ඇතිකර තිබේ.

දැනට පවතින රියැදුරු පුරප්පාඩු වෙනත් සේවාවල නිලධාරීන් සේවයේ යෙදවීමෙන් පුරවා ගැනීමට කටයුතු කරන අතර සිංහල - දෙමළ භාෂා පරිවර්තන කටයුතු දෙපාර්තමේන්තුවෙන් බාහිර නිලධාරියෙකු හට ගෙවීම්

කර ඉටුකරගෙන ඇත. දිගු කාලයක් තිස්සේ පැවැති මැනුම් උපකරණ කාර්මික ශිල්පී පුරප්පාඩු හා ලිතෝ තාක්ෂණ නිළධාරී පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හැකි වූ අතර කාර්යාල වල සාමාන්‍ය කටයුතු අතිකාල ගෙවීම් පදනම මත නිලධාරීන් රාජකාරි වල යෙදවීමෙන් ඉටුකරගෙන ඇත.
දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළයුතු නිලධාරීන් සංඛ්‍යාවේ පුරප්පාඩු පැවතියද අදාල කාර්යයන් නිසිලෙස කළමනාකරණය කරගැනීමෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා වැඩි ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවිය.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| පාඨමාලාව | නිලධාරීන් ප්‍රමාණය | කාලසීමාව | ආයෝජනය (රු. '000) | | පාඨමාලාවේ ස්වභාවය (විදේශීය / දේශීය | ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| **මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද වැඩමුළු** | | | | | | |
| ලේඛන අළුත්වැඩියාව පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දීමේ වැඩමුළුව | 11 | දින 03 | 21,665.00 | _ | දේශීය | මෙම වැඩමුළු සඳහා සහභාගි වූ සියළුම නිලධාරීන් තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ දැනුම ලබාගන්නා ලදී. |
| මිනින්දෝරු දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ArcGIS තාක්ෂණය පිළිබඳ වැඩමුළුව | 35 | දින 03 | – | – | දේශීය | |
| මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ අධ්‍යයන පුහුණුව සඳහා G-Suite ව්‍යවසාය පිළිබඳ වැඩමුළුව | 24 | දින 02 | – | – | දේශීය | |
| ආංකික ජර්නල් පිළිබඳ විශේෂ සාකච්ඡාව | 22 | දින 02 | – | – | දේශීය | |
| ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 117 | දින 01 | 69,255.00 | – | දේශීය | |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 74 | දින 01 | 56,375.00 | – | දේශීය | |
| **වෙනත් ආයතන මගින් සංවිධානය කළ කෙටි කාලීන පාඨමාලා පිළිබඳ විස්තර** | | | | | | |
| ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පාඨමාලාව | 02 | දින 02 | 3,600.00 | _ | දේශීය | මෙම වැඩමුළු සඳහා සහභාගි වූ සියළුම නිලධාරීන් තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ දැනුම ලබාගන්නා ලදී. |
| ප්‍රසම්පාදනය සහ වත්කම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 02 | දින 02 | 17,000.00 | _ | දේශීය | |
| වත්කම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 | දින 01 | _ | _ | දේශීය | |
| ආරක්ෂාව සහිත ජාල පරිපාලනය පිළිබඳ පුහුණුව | 02 | මාස 06 | 72,200.00 | _ | දේශීය | |
| පොදු ප්‍රසම්පාදනයේදී ලංසු ඇගයීම පිළිබඳ වැඩමුළුව | 01 | දින 03 | 18,000.00 | _ | දේශීය | |
| ඉදිකිරීම් කොන්ත්‍රාත් නීතිය සහ ආරවුල් විසඳීමේ පරිචය පිළිබඳ වැඩමුළුව | 01 | දින 01 | 3,500.00 | _ | දේශීය | |
| ජාල සමඟ පරිගණක දෘඩාංග පිළිබඳ පුහුණුව | 01 | මාස 06 | 34,100.00 | _ | දේශීය | |
| විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | 01 | දින 01 | 5,000.00 | _ | දේශීය | |
| රජයේ වැටුප් ක්‍රමය පිළිබඳ වැඩමුළුව | 02 | දින 01 | _ | _ | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විදේශ පුහුණු කටයුතු සඳහා නිවාඩු හා දීමනා ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | දින 01 | _ | _ | දේශීය | |
| රජයේ විගණන පනත පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම | 90 | දින 02 | _ | _ | දේශීය | |
| විනය කාර්ය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | 02 | දින 02 | 17,000.00 | _ | දේශීය | |
| **විදේශීය පුහුණු හා වැඩමුළු** | | | | | | |
| ITC පාදක ඉඩම් කළමනාකරණ පද්ධති සඳහා ජාතික ඉඩම් ධාරිතා ගොඩනැගීමේ ආකෘතිය | 01 | දින 05 | _ | 51,236.38 | විදේශීය | 1. මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ සියළුම නිලධාරීන් චන්ද්‍රිකා දුරස්ථ ග්‍රහණ (RS), ගෝලීය ස්ථාපන පද්ධතිය(GPS), භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS), ඡායාරේඛනමිතිය සහ සිතියම්ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම ලබාගෙන තිබේ.<br><br>2.භූ අවකාශීය දත්ත සහ ජීවයේ පළපුරුද්ද පිළිබඳ තාක්ෂණික සංවර්ධනයේ දැනුම බෙදාගැනීමේ අවස්ථාවක් ඔවුන්ට ලැබීඇත.<br><br>3.එය, භූ අවකාශීය ප්‍රජාව පිළිබඳ නියමුවන් සමඟ වඩා හොඳ සන්නිවේදනයක් සඳහා මහඟු අවස්ථාවක් විය.<br><br>4.තවත් වක්‍ර වාසියක් වූයේ රටට වැඩි ධාරිතා වර්ධන අවස්ථා ලැබීමයි. |
| ඉඩම් පරිපාලනයේදී පොදු/ පෞද්ගලික හවුල්කාරීත්වය පිළිබඳ ගෝලීය උපදේශනය | 01 | දින 03 | _ | _ | විදේශීය | |
| සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ අන්තර්ජාතික පුහුණුව | 01 | දින 07 | _ | _ | විදේශීය | |
| කාර්යක්ෂමතාව සඳහා ජාතික පාලන ලක්ෂ්‍යය කළමනාකරණය සහ භාවිතය | 01 | දින 45 | _ | 217,124.84 | විදේශීය | |
| FIG මහා සභා රැස්වීම-2019 | 01 | දින 05 | _ | 579,217.22 | විදේශීය | |
| ඒකාබද්ධ භූ අවකාශීය තොරතුරු සැකිල්ල ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීම පිළිබඳ 4වන ප්‍රවීණ උපදේශන සහ රැස්වීම | 01 | දින 04 | _ | 36,218.22 | විදේශීය | |
| දුරස්ථ ග්‍රහණ හා භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 03 | මාස 10 | _ | 396,702.98 | විදේශීය | |
| දුරස්ථ ග්‍රහණ පිළිබඳ 40වන ආසියානු සම්මේලනය (ACRS-2019) | 01 | දින 05 | _ | 490,213.52 | විදේශීය | |
| ගිම්හාන පාසල (GNSS -2019) | 01 | දින 06 | _ | - | විදේශීය | |
| ස්මාට් භූ අවකාශ එක්ස්පෝ-2019 | 02 | දින 03 | | - | විදේශීය | |
| ගෝලීය භූ අවකාශ තොරතුරු කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ කමිටු විද්වතුන්ගේ 9වන සැසිවාරය | 01 | දින 03 | _ | 57,916.36 | විදේශීය | |
| කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය | 01 | දින 07 | _ | 43,584.85 | විදේශීය | |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා -2019 පරිගණක මෘදුකාංග/ දෘඩාංග/ ජාල තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලා | 01 | දින 30 | _ | 237,067.73 | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව සඳහා යටිතල සංවර්ධනය සහ සැලසුම් පිළිබඳ පාඨමාලා | 01 | දින 21 | _ | 179,188.01 | විදේශීය | |
| දකුණ-ගිණිකොණදිග ආසියානු චන්ද්‍රිකා යෙදුම් වැඩමුළුව | 01 | දින 03 | _ | 35,936.00 | විදේශීය | |
| චීන සංවර්ධන අත්දැකීම් සහ එහි ප්‍රතිසංස්කරණ සහ ශ්‍රී ලංකාව සඳහා විවෘත ප්‍රතිපත්ති පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | දින 30 | _ | 213,143.00 | විදේශීය | |
| ප්‍රමාණකරණය හා සිතියම්කරණය පිළිබද නවමු පාඨමාලා-2019 | 01 | දින 11 | _ | _ | විදේශීය | |
| ගෝලීය භූ අවකාශ තොරතුරු සහ කළමනාකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය | 01 | දින 03 | _ | _ | විදේශීය | |
| චීන සංවර්ධන සහායක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා වර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | දින 15 | _ | 111,729.21 | විදේශීය | |

මෙම වැඩමුළු සඳහා සහභාගි වූ සියළුම නිලධාරින් තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාල දැනුම ලබාගන්නා ලද අතර එම දැනුම තම ශාඛාවන් වල අනෙකුත් නිලධාරීන්ටද ලබා දෙන ලදී.

## 7.0 අනුකූලතා වාර්තාව

| අංකය | අදාල අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල/ අනනුකූල) | අනුකූලතා නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීම | ඉදිරියේදී අනුකූල නොවීම වළක්වා ගැනීම සඳහා යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියා |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම නියමිත දිනදී ඉදිරිපත් කර තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| **2** | **පොත් සහ ලේඛන නඩත්තු කිරීම (FR445)** | | | |
| 2.1 | ස්ථාවර වත්කම් ලේඛන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 ට අනුව නඩත්තු සහ යාවත්කාලීන කර ඇත. | අනුකූල වේ | | |
| 2.2 | පෞද්ගලික පඩිනඩි ලේඛනය/ පෞද්ගලික පඩිනඩි කාඩ් නඩත්තු කර යාවත්කාලීන කර තිබේ. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම ලේඛන නඩත්තු කර යාවත්කාලීන කර තිබේ. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන නඩත්තු කර යාවත්කාලීන කර තිබේ. | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස්කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ටරි ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| 2.9 | පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| 2.10 | බැඳීම් (Commitment) ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| 2.11 | උපපත්‍රිකා පොත් ලේඛනය (GA-N20) නඩත්තු කර යාවත්කාලීන කරනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් පැවරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය අධිකාරිය ආයතනය තුළ පවරා තිබේ. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය අධිකාරිය පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර ඇත. | අනුකූල වේ | | |
| 3.3 | අධිකාරිය ඒ ආකාරයෙන් පවරා ඇත්තේ සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් හරහා සිදුවන පරිදිය. | අනුකූල වේ | | |
| 3.4 | රජයේ පේරෝල් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී 2014.05.11 දිනැති අංක 171/2004 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව ගණකාධිකාරීවරුන් විසින් පාලන කටයුතු පිළිපදිනු ලැබ තිබේ. | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබේ. | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබේ. | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේ. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර නියමිත දිනට NDB වෙත ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මූල්‍ය ප්‍රවාහය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත වේලාවට ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | සියළුම විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළදී විගණකාධිපති වෙතපිළිතුරු ලබා දී ඇත. | අනුකූල වේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 ට අනුව විගණකාධිපතිගේ උපදෙස් ලබා ගැනීමෙන් පසු අභ්‍යන්තර විගණන වාර්තාව පිළියෙල කර තිබේ. | අනුකූල වේ | | |
| 6.2 | සියළුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් ඇතුළත පිළිතුරු ලබා දී තිබේ. | අනුකූල වේ | | |
| 6.3 | අංක 2018-19 ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| 6.4 | මූල්‍ය රෙගුලාසි 134(3) අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **07** | **විගණන සහ කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් මෙම වසර තුළ අවම වශයෙන් 04ක් පවත්වා තිබේ. | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 පරිච්ඡේදයට අනුව වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කර ඇත | අනුකූල වේ | | |
| 8.2 | චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙක් පත් කරනු ලැබූ අතර ඉහත කී චක්‍රලේඛයේ 13 පරිච්ඡේදයට අනුව නම් කරන ලද නිලධාරියාගේ විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට යවනු ලැබීය. | අනුකූල වේ | | |
| 8.3 | භාණ්ඩ සමීක්ෂණ සිදු කරනු ලැබූ අතර රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 අනුව අදාළ වාර්තා නියමිත දිනදී විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබිණ. | අනුකූල වේ | | |
| 8.4 | භාණ්ඩ සමීක්ෂණය සහ වෙනත් නිර්දේශ මගින් අනාවරණය වූ අතිරික්තයන් සහ හිඟයන් චක්‍රලේඛයේ දක්වා ඇති කාල සීමාව ඇතුළත ක්‍රියාමාර්ග ගනු ලැබීය. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ බැහැර කිරීම මු.රෙ.772 ට අනුව සිදු කර තිබුණි. | අනුකූල වේ | | |
| **09** | **රථවාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස්කර තිබූ අතර නියමිත දිනදී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිණි. | අනුකූල වේ | - | - |
| 9.2 | ගර්හිත කිරීමෙන් පසු මාස 06කට අඩු කාල පරිච්ඡේදයක් තුළදී ගර්හිත රථ වාහන බැහැර කර තිබුණි. | අනුකූල වේ | - | - |
| 9.3 | රථ වාහන ලොග් පොත නඩත්තු කර යාවත්කාලීන කර තිබිණි. | 95%ක් පමණ අනුකූල වේ | - | නිසිපරිදි යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇත |
| 9.4 | සෑම රථවාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 සහ 110 අනුව ක්‍රියාමාර්ග ගෙන තිබේ. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාර රථවාහන ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කර තිබේ. | 95%ක් පමණ අනුකූල වේ | දීර්ඝකාලීන අලුත්වැඩියාවන් සඳහා යොමු කර ඇති වාහන සහ ගර්හිත කිරීමට ඇති වාහන වල සිදුකර නැත. | අලුත්වැඩියා වලින් පසු නිසිපරිදි ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමට උපදෙස් ලබාදී ඇත. |
| 9.6 | බදු පදනම මත ලබාගත් වාහන වල ලොග් සටහන් පොත්වල පූර්ණ අයිතිය බදු කාලසීමාවෙන් පසු මාරුකර තිබේ. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර සහතික කර තිබූ අතර නියමිත දිනදී විගණනය සඳහා සූදානම් කර තිබිණි. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂය තුළ හෝ පෙර වර්ෂවල සිට පවතින අක්‍රිය ගිණුම් පියවා ඇත. | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශන තුළින් අනාවරණය වී තිබූ ශේෂයන් සහ කළ යුතුව තිබී ඇති ශේෂයන් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගෙන තිබූ අතර එම ශේෂයන් මාසයක් ඇතුළතදී පියවා තිබුණි. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන භාවිතය** | | | |
| 11.1 | වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබිණි. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) අනුව වර්ෂය අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන නොඉක්මවන වගකීම් | අනුකූල වේ | | |
| **12** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම** | | | |
| 12.1 | සීමාවන් අනුකූල වී තිබිණි | අනුකූල වේ | | |
| 12.2 | හිඟ ණය පිළිබඳ කාල විශ්ලේෂණ සිදුකර තිබිණි. | අනුකූල වේ | | |
| 12.3 | එක් වසරකට වැඩි කාලයක් වන හිඟ ණය ශේෂ පියවා තිබිණි. | අනුකූල නොවේ | විශ්‍රාම,මියගිය, සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගේ වසර දහයට අඩු ණය ශේෂ පියවා ඇති අතර වසර දහයට වැඩි ණය ශේෂ පියවා නැත. | වසර දහයට වැඩි හිග ණය ශේෂ පොතෙන් කපා හැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | | |
| 13.1 | ඉකුත් තැන්පතු බැහැර කිරීම සම්බන්ධයෙන් මු.රෙ.571 අනුව ක්‍රියා කර තිබිණි. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා පාලන ලේඛනය යාවත්කාලීන කර නඩත්තු කර තිබිණි. | අනුකූල වේ | | |
| **14** | **අක්මුදල් ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වසර අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරනු ලැබීය. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371ට අනුව නිකුත් කරන ලද තත්කාරය උප අක්මුදල් කාර්ය සම්පූර්ණ කර මසක් ඇතුළත පියවා ඇත. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371ට අනුව අනුමත සීමාව ඉක්මවමින් තත්කාර්ය උප අක්මුදල් නිකුත් කර තිබිණි. | අනුකූල වේ | | |
| 14.4 | අක්මුදල් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සසඳනු ලැබ තිබිණි. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | ආදායමෙන් මුදල් ආපසු ගෙවීම් රෙගුලාසි ප්‍රකාර සිදු කර තිබිණි. | අනුකූල වේ | | |
| 15.2 | ආදායම් එකතු කිරීම, තැන්පතු ගිණුමට බැර නොකොට ආදායම් ගිණුමට සෘජුවම බැර කොට තිබිණි. | අනුකූල වේ | | |
| 15.3 | හිඟ ආදායම් ප්‍රතිලාභ, මු.රෙ.176 ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩලය තුළ කාර්ය මණ්ඩලයට මුදල් ගෙවා තිබිණි. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු නිකුත් කර තිබිණි. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | සියළුම වාර්තා 2017.09.20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 14/2017 ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු සැපයීම** | | | |
| 17.1 | තොරතුරු නිලධාරියෙක් පත් කරනු ලැබ ඇති අතර තොරතුරු දැන ගැනීමේ පනත සහ රෙගුලාසි ප්‍රකාරව යෝග්‍ය තොරතුරු ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර යාවත්කාලීන කරනු ලැබේ. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු මහජනයා වෙත වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රමවේද මගින් සපයා ඇති අතර මෙම වෙබ් අඩවිය මගින් රාජ්‍ය අධිකාරිය අගය කිරීමට/ චෝදනා කිරීමට මහජනයා වෙත පහසුකම් සලසා තිබේද? | අනුකූල වේ | | |
| 17.3 | ද්වි-වාර්ෂික සහ වාර්ෂික වාර්තා තොරතුරු දැනගැනීමේ පනතෙහි 08 සහ 10 වගන්ති ප්‍රකාරව ඉදිරිපත් කර තිබේ. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තිය, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2018(1) චක්‍රලේඛ ප්‍රකාරව සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබේ. | අනුකූල වේ | | |
| 18.2 | ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තිය සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ තක්සේරු කිරීම පිණිස චක්‍රලේඛයේ 2.3 පරිච්ඡේදයට අනුව ක්‍රමවේදයක් සකස් කර තිබේ. | අධීක්ෂණය සඳහා ක්‍රමවේද හඳුන්වා දිය යුතුය | - | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |
| **19** | **මානව සම්පත් සැලසුම පිළියෙළ කිරීම** | | | |
| 19.1 | 2018.01.24දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලසුම සකස් කර තිබේ. | අනුකූල වේ | | |
| 19.2 | ඉහතකී මානව සම්පත් සැලසුමෙහි වර්ෂයකට පැය 12ට නොඅඩු අවම පුහුණු අවස්ථාවක් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම සහතික කර තිබේ. | අනුකූල නොවේ | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා නිලධාරීන් සියළු දෙනාම සඳහා අවශ්‍ය පුහුණු වීම් අවස්ථා ලබාදීමට නොහැකි විය. | 2020 වාර්ෂික වැඩ සටහනට ඇතුළත් කර ඇත. |
| 19.3 | ඉහත කී චක්‍රලේඛ ඇමුණුම 01හි ආකෘතිය පදනම් කරගනිමින් සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තිබේ. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත කී චක්‍රලේඛයේ අංක 6.5 පරිච්ඡේදය පරිදි මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම ශක්‍යතා වර්ධන වැඩසටහන් සංවිධානය සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම් සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර වගකීම පවරනු ලැබීය | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද පිළිතුරු** | | | |
| 20.1 | පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් විගණන ඡේදයන්හි පෙන්වා දී ඇති අඩුලුහුඬුකම් නිවැරදි කර තිබේ. | ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හා මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම් වලදී දැනුවත් කර ඇත | | පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග යොදා ඇත. |

## 8.0 සමාප්තිය

සමාලෝචිත වසර සඳහා සැලසුම් කළ පරිදි ඉලක්කගත කාර්යයන් සපුරාලීමට අමතරව රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මෙන් ම සමාජ සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ හදිසි මැනුම් හා සිතියම් අවශ්‍යතාවයන් සාර්ථකව ඉටු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ඒ සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම වැඩි දියුණු කර ගැනීමට ද, නව තාක්ෂණික මෙවලම් හඳුන්වාදීමට ද හැකිවූ අතර මැනුම් කටයුතුවල ප්‍රගතිය 122% දක්වා ළඟා කර ගැනීමට ද හැකි විය. එවන් කාර්ය සාධනයක් මෙම වර්ෂය තුළදී ඉටු කර ගැනීමට සහාය වූ දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවලට හා සියලුම මට්ටම්වලට අයත් සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සේවය ඉහළින්ම අගය කරන බව මෙහිලා සනිටුහන් කළ යුතුය. එමෙන්ම මෙම කාර්යයන් ඉටු කිරීමේ දී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් මෙන් ම සියලුම වෘත්තීය සමිතිවලින් ද ලද සහයෝගය අගය කරමි.

ඒ.එල්.ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා
සර්වේයර් ජනරාල්

**සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් මගින් ඉටුකළ කාර්යයන්**

## 1. මානව සම්පත් හා පාලන අංශය

**කාර්යභාරය**

දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම ඇතුලු මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ආයතනික හා පාලන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම

**කාර්යසාධනය**

මානව සම්පත් කළමනාකරණය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

| | කාර්යය | කටයුතු කිරීමට නියමිත වූ සංඛ්‍යාව | කටයුතු කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | සේවයට බඳවා ගැනීම් | 441 | 366 |
| 2 | විභාග පැවැත්වීම් | 60 | 60 |
| 3 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම් | 8 | 8 |
| 4 | සේවය ස්ථිර කිරීම් | 542 | 481 |
| 5 | උසස් කිරීම් | 331 | 224 |
| 6 | වැටුප් වර්ධක ගෙවීම් | 2,602 | 1,678 |
| 7 | බඳවා ගැනීමේ පරිපාටි සැකසීම් | 1 | 1 |
| 8 | සේවය හැරයාම් | 30 | 30 |
| 9 | විශ්‍රාම යාම් | 320 | 320 |
| 10 | ඉල්ලා අස්වීම | 22 | 17 |
| 11 | වැඩ තහනම් කිරීම් | 1 | 1 |
| 12 | නැවත සේවය පිහිටුවීම් | 9 | 9 |
| 13 | විනය පරීක්ෂණ | 3 | 3 |
| 14 | විදේශ නිවාඩු අනුමත කිරීම් | 79 | 78 |
| 15 | ඇප ආරම්භ කිරීම් | 57 | 57 |
| 16 | ඇප නිදහස් කිරීම් | 2 | 2 |
| 17 | ණය අනුමත කිරීම් (දේපළ) | 29 | 29 |

දෙපාර්තමේන්තු වාහන වල සිදුවූ අනතුරු සම්බන්ධව පහත පරිදි කටයුතු කර ඇත.

| 2019 වර්ෂය ආරම්භයේ පැවති අනතුරු ගොනු සංඛ්‍යාව | 2019 වර්ෂය තුළ දී සිදු වූ අනතුරු සංඛ්‍යාව | 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ මුළු අනතුරු ගොනු සංඛ්‍යාව | 2019 වර්ෂය තුළ අවසන් කළ අනතුරු ගොනු සංඛ්‍යාව | 2019.12.31 දිනට ක්‍රියාත්මකව ඇති ඉතිරි අනතුරු ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 60 | 16 | 76 | 28 | 48 |

රු. 1,130,881.39ක් වැය කර, සර්වේයර් ජනරාල් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති වාහන 07ක රු. 50,000.00 ඉක්ම වූ අලුත්වැඩියාවන් සිදුකර ඇත.

## 2. නීති අංශය

**කාර්යභාරය**

දෙපාර්තමේන්තුවට සම්බන්ධ නීතිමය කටයුතු මෙහෙයවීම, දිසා අධිකරණය / මහාධිකරණය / අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණයන්හි දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීමේදී හා දෙපාර්තමේන්තුවට එරෙහිව නඩු පැවරීම් සිදුවන අවස්ථාවන්හිදී නීතිපතිවරයා වෙත සහයෝගය දැක්වීම, දෙපාර්තමේන්තු නිලධාරීන් රාජකාරි කටයුතුවලදී මුහුණපාන නීතිමය ගැටලු වලට විසඳුම් ලබාදීම,

දෙපාර්තමේන්තුවට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන පරීක්ෂණවලදී සර්වේයර් ජනරාල් වෙනුවෙන් පෙනී සිටීම

**කාර්යසාධනය**

අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කර ඇත.

| අධිකරණය | 2019.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2019 වසර තුළදී ලැබුණු සංඛ්‍යාව | 2019 වසර තුළදී අවසන්වූ සංඛ්‍යාව | 2019.12.31 දිනට පවතින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 11 | 08 | 05 | 14 |
| අභියාචනාධිකරණය | 26 | 04 | 14 | 16 |
| මහාධිකරණය | 03 | 03 | - | 06 |
| දිසා අධිකරණය | 22 | 08 | 01 | 29 |
| කම්කරු වන්දි උසාවිය | - | 01 | 01 | - |

මූලික කටයුතු සිදුකරන ගොනු සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කර ඇත.

| 2019.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2019 වසර තුළදී ලැබුණු සංඛ්‍යාව | 2019 වසර තුළදී අවසන්වූ සංඛ්‍යාව (මුදල් අයකර හෝ කපාහැරීමට යොමුකර) | 2019 වසර තුළදී නීතිපති වෙත යොමු කරන ලද ගොනු සංඛ්‍යාව | 2019.12.31 දිනට කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 32 | 10 | 16 | - | 26 |

නඩු පැවරීම සඳහා නීතිපති වෙත ගොනු යොමු කිරීම පහත සඳහන් පරිදි සිදුකර ඇත.

| 2019.01.01 දිනට යොමු කර පැවති ගොනු | 2019 වසර තුළදී යොමු කරන ලද ගොනු | 2019 වසර තුළදී නීතිපති උපදෙස් මත අවසන් කළ ගොනු සංඛ්‍යාව | 2019.12.31 දිනට නඩු පැවරීමට අදාලව කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| 16 | - | 05 | 11 |

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු යොමු කිරීම පහත සඳහන් පරිදි සිදුකර ඇත.

| 2019.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2019 වසර තුළදී ලැබුනු සංඛ්‍යාව | 2019 වසර තුළදී අවසන්වූ සංඛ්‍යාව | 2019.12.31 දිනට පවතින සංඛ්‍යාව |
|---|---|---|---|
| 09 | 03 | 01 | 11 |

## 3. ගිණුම් අංශය

**කාර්යභාරය**

ගෙවීම් කාර්යාල 34 කින් සමන්විත දෙපාර්තමේන්තු ගිණුම් පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ වාර්ෂික පුනරාවර්තන හා මූලධන වියදම් ඇස්තමේන්තු සකස් කර රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා ඒ අනුව ලැබෙන ප්‍රතිපාදන සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් අක්මුදල් ලබාගෙන සියලු කාර්යාල වෙත නිකුත්කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුව ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීම

දෙපාර්තමේන්තු වෙත ලබාදී ඇති ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් දරමින් මූල්‍ය කළමනාකරණය පවත්වා ගැනීම

දෙපාර්තමේන්තුවේ ආදායම් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල මගින් එකතු කිරීමට කටයුතු කිරීම

විගණන විමසුම් සඳහා පිළිතුරු නිසි පරිදි අදාල පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම හා දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නියමිත දිනට ඉදිරිපත් කිරීම

**කාර්යසාධනය**

කරුණාකර ප්‍රධාන වාර්තාවේ පිටු අංක 09-17 ( වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය ), පිටු අංක 22-25 ( අනුකූලතා වාර්තාව ) බලන්න.

## 4. උපකරණ හා ගොඩනැගිලි අංශය

**කාර්යභාරය**

සර්වේයර් ජනරාල් කාර්යාලය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල, දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල, සහ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලාවල සිදු කළ යුතු අලුත්වැඩියාවන් සහ නව ඉදිකිරීම් පිළිබඳව කටයුතු කිරීම

මැනුම් උපකරණ සහ එහි උපාංග අලුත්වැඩියාව සහ සේවා කිරීම

මැනුම් උපකරණ අංක ශෝධනය (calibration)

මැනුම් පාලන ලක්ෂ්‍ය සඳහා අවශ්‍ය බෝල්ට් නිෂ්පාදනය

දෙපාර්තමේන්තුව සතු පෙරසවි කඳවුරු සමීක්ෂණ කටයුතු මෙහෙයවීම, පෙරසවි කඳවුරු ගැලවීම සහ සවිකිරීම් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ආරක්ෂාව සහ පවිත්‍රතාවය සම්බන්ධව ක්‍රියා කරන බාහිර ආයතන වල කටයුතු සම්බන්ධීකරණය

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලී පදනම මත ලබාගැනීමේ කටයුතු සඳහා අදාල ගැසට් නිවේදන සැකසීම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තු හැඳුනුම්පත් නිකුත් කිරීම

**කාර්යසාධනය**

සිදුකරන ලද රුපියල් 50,000.00 ඉක්ම වූ නව ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්

| | |
|---|---|
| මැදවච්චිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීම | 22,103,000.00 |
| මාදම්පේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීම | 19,713,000.00 |
| ඇඹිලිපිටිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීම | 18,504,000.00 |
| ගිරිතලේ මිනින්දෝරු අධිකාරි නිලනිවස ඉදිකිරීම | 17,797,000.00 |
| ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීම | 13,129,000.00 |
| කරුන්පිරිකාඩු අතරමැදි කාර්යාලය විධිමත්ව සකස් කිරීම | 8,185,000.00 |
| සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ පිටත බිත්ති වල තීන්ත ආලේප කිරීම | 5,847,181.15 |
| සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ සඳළුතලය සඳහා කාපට් මිලදී ගැනීම | 367,200.00 |
| සර්වේයර් ජනරාල් කාර්යාලයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය අලුත්වැඩියා කිරීම | 226,000.00 |
| සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ සඳළුතලය නවීකරණය කිරීම | 72,200.00 |
| ත්‍රිපාද අලුත්වැඩියාවට ලී මිලදී ගැනීම | 65,000.00 |
| ප්‍රාථමික සේවා නව නේවාසිකාගාරයේ ඇඳන් පිළිසකර කිරීම | 54,455.00 |

වාර්ෂික පූර්ණමාන සේවා ලේඛනය අනුව පූර්ණමාන 209ක් උපකරණ කාර්මික ශිල්පීන් විසින් සේවාකර ක්ෂේත්‍රයට නිකුත් කර ඇත.

සේවා අලුත්වැඩියාව හේතුවෙන් ලැබෙන පූර්ණමාන උපාංග 239ක ප්‍රමාණයක් අලුත්වැඩියා කර නිකුත් කර ඇත.

මැනුම් පාලන ලක්ෂ්‍ය සඳහා A වර්ගයේ බෝල්ට් 1,600ක්ද C වර්ගයේ බෝල්ට් 2,750ක්ද නිෂ්පාදනය කරන ලදී.

බාහිර පාර්ශවයේ පූර්ණමාන අංක ශෝධනය කර රු.34,500/-ක මුදලක් දෙපාර්තමේන්තුවට උපයා දී ඇත.

## 5. ප්‍රසම්පාදන හා සැපයීම් අංශය

**කාර්යභාරය**

දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ හා සේවා අවශ්‍යතා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට ලබාගැනීම සහ බෙදා හැරීම, සියලුම ගබඩා ලෙජර නිසි ලෙස යථාවත් කර පවත්වා ගෙන යාම සහ වාර්ෂික ගබඩා සමීක්ෂණය අධීක්ෂණය කර නිෂ්කාෂණ ලබා දීම

**කාර්යසාධනය**

2019 වසර තුළ දී රුපියල් මිලියන 100 කට අධික ප්‍රාග්ධන මිලදී ගැනීම් ද රුපියල් මිලියන 6.8 කට අධික පුනරාවර්තන මිලදී ගැනීම්ද , බිම් සවිය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 3.1 කට අධික පුනරාවර්තන මිලදී ගැනීම් ද, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සඳහා රුපියල් මිලියන 5.1 කට ආසන්න ප්‍රාග්ධන මිලදී ගැනීම් ද සිදු කර ඇත.

සර්වේයර් ජනරාල් කාර්යාලයේ විවිධ අංශ, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ රට පුරා විසිරී සිටින මිනින්දෝරු නිලධාරීන් විසින් නඩත්තු කර ගෙන යනු ලබන ගබඩා ලෙජර 848 ට අදාලව ගබඩා සමීක්ෂණ කටයුතු නිම කර ඇත.

ඒවායින් රජයේ මිනින්දෝරුවරුන් 643 දෙනෙකුට ද, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සියල්ලටමද, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සියල්ලටමද, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 89 කට හා දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ඇති ගබඩා ඒකක සියල්ලටමද, සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන සියල්ලටම ද, සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංශ සියල්ලටම ද, 2018.12.31 දිනට නිෂ්කාෂණ සහතික ලබා දී ගොනු නිරවුල් කරන ලදී.

විශ්‍රාම ගිය හා ඉල්ලා අස් වී ගිය නිලධාරීන් 11 දෙනෙකු සඳහා ස්ථිර නිශ්කාෂණ ද, උසස්වීම් ලැබූ රජයේ මිනින්දෝරු නිලධාරීන් 09 දෙනෙකු සඳහා තාවකාලික නිශ්කාෂණ ද ලබා දී ඇත.

## 6. තොරතුරු තාක්ෂණ අංශය

**කාර්යභාරය**

අන්තර්ජාල සම්බන්ධතා හා විද්‍යුත් තැපැල වැනි දියුණු සන්නිවේදන ක්‍රම ද භාවිතා කරමින් මහජනතාවට ඉඩම් තොරතුරු අන්තර්ජාලය මඟින් ලබා ගැනීම, පරිපාලන කටයුතුවලට සහායක සේවාවක් ලෙස මානව සම්පත් කළමනාකරණය, දත්ත ගබඩා කිරීම, තොරතුරු ඉක්මනින් හා ක්‍රමවත්ව ලබා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදීම

**කාර්යසාධනය**

පහත සඳහන් දත්ත පද්ධතීන් හා මෘදුකාංග 2019 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් පිළියෙළ කර ඇත.

**ඉඩම් තොරතුරු දත්ත පද්ධතියේ දත්ත බාගත කරගැනීම සඳහා මෘදුකාංගය**

ඉඩම් තොරතුරු දත්ත පද්ධතියෙහි ඇති දත්තයන්ගෙන් අවශ්‍ය බිම් කැබැල්ලක් හෝ කිහිපයක් "Shape File" ආකාරයෙන් බාගත කරගැනීමට හා කැඩැස්තර සිතියම්හි කලාපයන්ට අදාල වට මායිමද "Shape File" ආකාරයෙන් බාගත කරගැනීමට සියලුම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්ට පහසුකම් සලසා ඇත. මෙමගින් පසුකාලීන මැනුම් වලට අදාල දත්තයන්හි නිරවද්‍යභාවය පරීක්ෂා කළ හැක.

**සරල සිතියමක් නිර්මාණය කරගැනීමට ¨My Map" මෘදුකාංගය**

"My Map" මගින් මහජනයාට තමන්ගේම සරල සිතියමක් නිර්මාණය කිරීමට පහසුකමක් ලබා දී ඇත. මෙහිදී පදනම් දත්ත ලෙස 1: 50,000 නව හූ ලක්ෂණාත්මක සිතියමේ මූලික දත්ත ස්ථර භාවිත වන අතර මහජනතාවට අවශ්‍ය දත්ත ස්ථර තෝරා ගතහැකි අතර තමන්ගේ දත්ත "Shape File" හෝ "KML" හෝ "CSV" හෝ ආකාරයට උඩුගත කර තමන්ට අවශ්‍ය සිතියම කිසිදු වියදමකින් තොරව නිර්මාණය කර මුද්‍රණය කරගත හැකිය. මීට අමතරව අවකාශීය විශ්ලේෂණය ගැන උනන්දුවක් දක්වන්නේ නම් විශ්ලේෂණ සිතියමක්ද නිර්මාණය කිරීමට පහසුකම් සලසා ඇත. මෙම සේවාව දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි වෙබ් සේවාවන්හි "My Map" මගින් ලබාගත හැක.

**දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සඳහා ලේඛන කළමනාකරණ දත්ත පද්ධතිය (eDOCs)**

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයන්හි ලේඛන කළමනාකරණය සඳහා මේ වනවිට "ADITS" මෘදුකාංගය භාවිත කරන අතර ලේඛනයක් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා නිලධාරීන්ට දිස්ත්‍රික් කාර්යාලයටම පැමිණීමට සිදුවේ. මෙම නව eDOCs දත්ත පද්ධතිය අන්තර්ජාලය තුළින් භාවිත කරන බැවින් ඕනෑම ස්ථානයක සිට ලේඛන පිළිබඳ තොරතුරු ලබාගත හැක. මෙමගින් ඉහළ පරිපාලනයටද නිලධාරීන්ගේ ලේඛන භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගතහැකි අතර වාර්ෂික ලේඛන සංගණනයද ඉතා පහසුවෙන් කළ හැකිවේ.

**පසුකාලීන මැනුම් ඉල්ලීම්වලට අදාල බලයලත් මිනින්දෝරුවරුන් සඳහා වන ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය (TL-DMS)**

කැඩැස්තර සිතියම්වලට අදාල පසුකාලීන මැනුම් සඳහා බලයලත් මිනින්දෝරුවරුන්ට ඉඩම් විස්තර ලැයිස්තුවක් නිර්මාණය කර ඇති අතර එය අන්තර්ජාලය තුළින් භාවිත කිරීමේ පහසුව සලසා ඇත.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් පිළිබඳ ගැසට් නිවේදන දැක්වෙන දත්ත පද්ධතිය**

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත්වන ග්‍රාම නිලධාරී වසම් හා පරිපාලන සීමා පිළිබඳ ගැසට් නිවේදන ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර එය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළින් භාවිත කළ හැක.




**බලයලත් මිනින්දෝරුවරුන් නිමකරන ලද පිඹුරු ගබඩා කිරීම සඳහා භාවිතා කළහැකි දත්ත පද්ධතිය**

බලයලත් මිනින්දෝරුවරුන් නිමකරන ලද පිඹුරු ගබඩා කිරීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර එමගින් පිඹුරෙහි පරිලෝකන පිටපතක් උඩුගත කිරීමට බලයලත් මිනින්දෝරුවරුන්ට පහසුකම් සලසා ඇත. මීට අමතරව අවශ්‍ය අවස්ථාවකදී තමා විසින් නිමකරන ලද පිඹුරක පිටපතක් බාගත කිරීමටද හැකියාව ඇත. මෙම දත්ත පද්ධතියේ භාවිතය පිළිබඳව බලයලත් මිනින්දෝරුවරුන් දැනුවත් කිරීමට අදාල කටයුතු කරන මෙන් සර්වේයර් ජනරාල් විසින් ඉඩම් මැනුම් සභාවට දැන්වීමට කටයුතු කර ඇත.

**සර්වේයර් ජනරාල් කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය භාවිතයෙන් පහත සඳහන් සේවාවන් ලබාදී ඇත.**

- **“HuRIMS”දත්ත පද්ධතියේ දත්ත යාවත්කාලීන කිරීමේ හැකියාව**

  මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතියේ (HuRIMS) ඇතුළත් කර ඇති දත්ත යාවත්කාලීන කිරීම සඳහා අදාල නිලධාරියාටම එම තොරතුරු ඇතුළත් කිරීමට හැකියාව ලබාදී ඇත.

  මෙමගින් පහත සඳහන් දත්ත යාවත්කාලීන කිරීම සඳහා පහසුකම් සපයා ඇත.

  - නිලධාරියාගේ ඡායාරූපය
  - හැඳුනුම්පතේ පරිලෝකන පිටපත
  - නම සිංහල හා දෙමළ බසින්
  - ජංගම දුරකතන අංකය
  - ස්ථිර ලිපිනය හා තාවකාලික ලිපිනය
  - විද්‍යුත් ලිපිනය

- **සර්වේයර් ජනරාල් කාර්යාලයේ නිලධාරීන් කාර්යාල පරිශ්‍රයට පැමිණෙන වාහන පිළිබඳ තොරතුරු රැස්කිරීමේ දත්ත පද්ධතිය**

  සර්වේයර් ජනරාල් කාර්යාල පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කාර්යාල පරිශ්‍රයට පැමිණෙන වාහන ලියාපදිංචි කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා මෙම ආකෘති පත්‍රය නිර්මාණය කර ඇත.

- **ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම**

  පළාත් පාලන ආයතන වලින් හා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබෙන බලයලත් මිනින්දෝරුවරුන්ගේ පිඹුරු පරිලෝකන පිටපත් ගබඩා කිරීම සඳහා ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයට මෙම දත්ත පද්ධතිය නිර්මාණය කර ඇත.

- **දෙපාර්තමේන්තු හැඳුනුම්පත නිර්මාණය කිරීම**

  දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සඳහා නව හැඳුනුම්පතක් නිර්මාණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍යවන මූලික තොරතුරු මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතියෙන් (HuRIMS) ලබා ගැනීමට කටයුතු සලසා ඇත. මෙම හැඳුනුම්පත මුද්‍රණය කිරීම සඳහා උපකරණ හා ගොඩනැගිලි අංශයට සර්වේයර් ජනරාල් කාර්යාලයේ අභ්‍යන්තර පරිගණක ජාලය තුලින් පිවිසිය හැකි “SGO Services (it.survey.lk) ” හි Print My ID මගින් පහසුකම් සලසා ඇත.




- **දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන චක්‍රලේඛ දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම**

  දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා ප්‍රගති අංශයට අවශ්‍ය පහසුකම් සලසාදී ඇත.

- **‘SRIMS” දත්ත පද්ධතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධ කිරීම**

  මැනුම් ඉල්ලීමක් ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් අන්තර්ජාලය භාවිතයෙන් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉදිරිපත් කිරීම සඳහා මැනුම් ඉල්ලීම් කළමනාකරණ දත්ත පද්ධතිය (SRIMS) නවීකරණය කර ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත. මෙම නවීකරණය මගින් ඉතා ඉක්මනින් මැනුම් ඉල්ලීමක් නිකුත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන්ට පහසුකම් සැලසේ.

- **මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පුස්තකාලය සඳහා වන දත්ත පද්ධතිය**

  දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පුස්තකාලය සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇත. එමඟින් පුස්තකාලයේ පවතින පොත් පිළිබඳ තොරතුරු, නිකුත් කිරීම් හා ප්‍රමාද වීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත.

- **කාර්යාල කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම**

  ගාල්ල සහ පොළොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සඳහා කාර්යාල කළමනාකරණ දත්ත පද්ධතියක් නිර්මාණය කරන ලද අතර මෙමගින් කාර්යාලයට ලැබෙන ලිපි පිළිබඳ පසු විපරම් කිරීමේ හැකියාව ඇත.

- **කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය නවීකරණය කිරීම**

  කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ අක්‍රීයව පැවති පරිගණක ජාල පද්ධතිය නවීකරණය කර රාජකාරි අවශ්‍යතා අනුව අන්තර්ජාල පහසුකම පරිශීලනය කිරීමට හැකිවන අයුරින් ජාල පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන ලදී.

මීට අමතරව මෙම වසරේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් පහත සඳහන් සේවාවන් සපයන ලදී.

- ප්‍රධාන කාර්යාලයේ පරිගණක හා පරිගණක උපාංග සඳහා වන පරිගණක දෝෂ නිවැරදි කිරීම හා ඊට අවශ්‍ය උපදේශන සේවා සැපයීම
- ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය කළමනාකරණය කිරීම හා පවත්වා ගෙන යාම
- මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් පිළියෙල කරන ලද අනෙකුත් දත්ත පද්ධතීන් පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම
- දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම
- ප්‍රධාන කාර්යාලයේ දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පද්ධතිය පවත්වාගෙන යාම
- දෙපාර්තමේන්තු දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපින නාමාවලිය පිළිබඳ තොරතුරු දත්ත පද්ධති පවත්වා ගෙන යාම
- ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය හා මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය භාවිතය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම

**ඵලදායීතා ප්‍රවර්ධනය**

2018 ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලියේදී වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ක්ෂුද්‍ර අංශයෙන් තුන්වන ස්ථානයන් ලබා ගත් අතර සර්වේයර් ජනරාල් කාර්යාලය රාජ්‍ය අංශයේ අන්තර් දෙපාර්තමේන්තු කාණ්ඩයෙන් විශේෂ කුසලතා සම්මානයක් ලබා ගන්නා ලදී. එහි සම්මාන ප්‍රදානෝත්සවයන් පිළිවෙළින් 2019.03.26 දින බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී හා 2019.12.26 දින සුහුරුපාය ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.









**ඵලදායීතා වැඩසටහන මිනින්දෝරු දෙපාර්තමේන්තුව තුළ සක්‍රීයව ක්‍රියාත්මක කිරීම**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ මට්ටමකට ළඟාවීමට ක්ෂේත්‍ර කාර්යාලවල සක්‍රීය දායකත්වය ලබා ගැනීම අනිවාර්ය සාධකයක් වන බැවින්, ඒ සඳහා සේවක තෘප්තිමත්භාවය වැඩිදියුණු කර, කණ්ඩායම් අතර සුහදතාවය වර්ධනය කර, මහජන මිතුරු හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සියලුම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල අතර තරඟයක් 2019 වසරේදී පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා ප්‍රාදේශීය මිනින්දෝරු / භූමිතික කාර්යාල 83 ක් සහභාගී විය.

## 7. භූමිතික මැනුම් ශාඛාව

**කාර්යභාරය**

දිවයින ආවරණය වන පරිදි සිරස් හා තිරස් භූමිතික පාලන ජාලය පවත්වා ගැනීම හා භූමිතික මැනුම් කටයුතු වලට අදාල සම්මතයන් සැකසීම, දත්ත බැංකු නඩත්තු කිරීම හා අධීක්ෂණ කටයුතු.

**කාර්යසාධනය**

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1. | GPS පාලන ලක්ෂ්‍ය 5,024ක් පිහිටුවීම හා කි.මී.1,335ක් යථාතත්‍ය මට්ටම් රේඛා පිහිටුවීම |
| 2. | වෙරළට ඔබ්බෙන් වූ වැලි කැණීම්, ගොඩකිරීම් සහ තොග ගොඩ ගැසීම සඳහා පොම්ප කිරීම (කෙරවලපිටිය - මුතුරාජවෙල ) ව්‍යාපෘතිය සඳහා වැලි තොග පරිමාව ගණනය කර අදාල වාර්තාව සැකසීම. |
| 3. | ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවට අයත් තෙල් නල මාර්ග පරිශ්‍රයේ ලබාදෙනලද GPS ඛණ්ඩාංක GPX වලට පරිවර්තනය කර වාර්තාව ලබා දීම. |
| 4. | ඉඩම් කැබලි මිලියන 1.1ක් මැනීමේ ව්‍යාපෘතිය (ගාල්ල- නෙළුව) සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමසාරිස් සභාව සඳහා GPS ලක්ෂ්‍ය නිරීක්ෂණ කිරීම |
| 5. | මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයේ - නඩු අංක B/232/2019 හා B/09/2019 අදාළව GPS උපකරණ 03ක දත්ත නිරීක්ෂණය කර සිතියම් හා පිඹුරු ලබා දීම. |
| 6. | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක (M/UB/ 8480/01/2019) සඳහා GPS උපකරණයට අදාලව වාර්තාව සැපයීම |
| 7. | බේස්ලයින් ව්‍යාපෘතිය - අදියර 3 සඳහා අවශ්‍ය GPS ලක්ෂ්‍ය නිරීක්ෂණය කිරීම |
| 8. | යාපනය පලාලි ගුවන්තොටුපල මැනුම් කටයුතු |
| 9. | මන්නාරම සුළං බලශක්ති ව්‍යාපෘතියට අදාලව දත්ත විශ්ලේෂණය කිරීම |
| 10. | මුතුරාජවෙල කර්මාන්ත පර්යන්ත මාර්ගය සඳහා තාවකාලික පිල් ලකුණු සමීක්ෂණ කටයුතු |
| 11. | කොළඹ වරාය නගරය සඳහා පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 12. | කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපල පරිශ්‍රය සඳහා භූ ලක්ෂණාත්මක සිතියම පිළියෙළ කිරීම |
| 13. | මොරගහකන්ද ව්‍යාපෘතියට අදාලව පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 14. | බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ අදියර 3 - ව්‍යාපෘතියේ තෘතියික මට්ටම් ලබා ගැනීම |
| 15. | පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 16. | බණ්ඩාරවෙල ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත ගුවන්තොටුපොල සඳහා අදාල ප්‍රදේශයේ මැනුම් කටයුතු සිදුකිරීම |
| 17. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැව් සංවර්ධනයට අවශ්‍ය පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 18. | මාර්ග සංවර්ධන අධිකාරියේ කලවාන-දෙනියාය මාර්ගයේ සංවර්ධනයට අවශ්‍ය පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ සේවා සැපයීම්**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1. | බලයලත් මිනින්දෝරුවරුන් සහ වෙනත් ආයතන වෙත පාලන ලක්ෂ්‍ය වල සහ පිල් ලකුණු වල විස්තර සැපයීම |
| 2. | SLCORSnet තාක්ෂණය භාවිතයෙන් මැනුම් කටයුතු කිරීම සඳහා අවශ්‍ය සේවාවන්, රජයේ ආයතනවල භාවිතා කරන්නන් 34කට සහ බලයලත් මිනින්දෝරුවරුන් වැනි පෞද්ගලික අංශයේ භාවිතා කරන්නන් 12කට සැපයීම. (මෙමගින් උපයන ලද ආදායම රු. 419,880.00කි) |
| 3. | පාලන ලක්ෂ්‍ය සහ පිල් ලකුණු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම |
| 4. | SLCORSnet සහ RTK තාක්ෂණය භාවිතයෙන් මැනුම් කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්, බලයලත් මිනින්දෝරුවරුන් සහ වෙනත් ආයතන වෙත පුහුණු කිරීම සහ වැඩමුළු පැවැත්වීම |

## 8. විශේෂ මැනුම් හා තත්ත්ව පාලන අංශය

**කාර්යභාරය**

නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන් හා හදිසි මැනුම් අවශ්‍යතා කාර්යක්ෂමව ඉටුකර දීම, භූමි තොරතුරු සම්බන්ධ අර්බුදකාරී ප්‍රශ්නවලදී නියමිත තත්ත්ව පාලනයන් සිදුකොට ගුණාත්මක භූමි තොරතුරු අදාල අංශයන් වෙත ඉදිරිපත්කිරීම, දිවයිනට බලපාන හදිසි ආපදා තත්වයන්හීදී ජනතාවට අවශ්‍ය සහන සැපයීම කාර්යක්ෂමව ඉටුකර දීම ආදී ජාතික සංවර්ධන වැඩපිළිවෙළ සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරෝගාමී දායකත්වයක් සැපයීම.

**කාර්යසාධනය**

- නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් Calibration for Master Landing Compass, Calibration for Medium Landing Compass සහ Jig Calibration ආදී දෙපාර්තමේන්තුවේ වෙනත් අංශ මගින් ඉටුකිරීමට අපහසු විශේෂ මැනුම් කාර්යයන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඉටුකර දී ඇත.
- දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ හා තදාසන්න ගංවතුර තත්වය පාලනය කිරීම සඳහා කැලණි ගංඉවුර දිගේ මැනුම් කටයුතු කිරීම හා කැලණි ගඟේ පාලම් හතක් සඳහා මධ්‍යන්‍ය මුහුදු මට්ටම පිහිටුවීම
- ත්‍රිකුණාමලය පුරාවිද්‍යා ප්‍රදේශ මැනුම් කටයුතු සිදුකිරීම - අරිසිමලේ, බඹරගල, මිහිඳු ලෙන, සප්ත නාග, දෙබර ගල, සංබමලේ, බාහිය පබ්බත, ඇතා නැගි කන්ද
- සිතුල්පව්ව හා මිහින්තලේ පූජා භූමිවලට අයත් ඉඩම් මැන මායිම් නිරවුල් කිරීම
- කොච්චිකඩේ ශා. අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පිපිරීම සම්බන්ධ මැනුම් කිරීම
- කටාන කටුවාපිටිය දේවස්ථානයේ බෝම්බ පිපිරීම සම්බන්ධ මැනුම් කිරීම
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ස්ථිර තුරු ලතා සීමාව සළකුණු කිරීම
- ආනලතිව් හා නයිනතිව්, කච්චතිව් දූපත් මැනුම් කිරීම
- ජඳුර ගල් වැඩ බිමෙහි මෙතෙක් කඩන ලද ගල්වල භෞතික ප්‍රමාණය ගණනය කිරීම
- මුලතිව් මුහුදුබඩ පත්තුවේ වෙට්ටවලෙයි පුරාවිද්‍යා ප්‍රදේශයේ පිඹුරක් සකස් කිරීම
- කිරම, වරාපිටිය වැවෙහි ඉංජිනේරු මැනුමක් සිදු කිරීම
- දොළුව වරියගලවත්ත හා ඕපල්ගල වන රක්ෂිත මැනුම් කිරීම
- වත්තල - මාබෝල නගර සභා ඉඩමේ ගැටළු මැනුම් කිරීම
- පාසල් දත්ත පද්ධතිය සකස් කිරීම
- හක්ගල දැඩි ස්වභාව රක්ෂිතය සඳහා ව්‍යවස්ථාපිත පිඹුරක් සකස් කිරීම
- දීමනා පත්‍ර ලබාදීම සඳහා ඇල්පිටිය හා නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉඩම් මැනුම් කිරීම
- මුතුරාජවෙල තෙත්බිමෙහි පිඹුරක් සකස් කිරීම
- කටුනායක ගුවන් තොටුපල ප්‍රදේශයේ මැනීම් කර පිඹුරක් සකස් කිරීම
- මාලිගාවත්ත දුම්රිය මැනුම් නැවත පරීක්ෂාව සිදු කිරීම
- අලුතින් ඉදිවන කළු ගඟ මොරගහකන්ද යෝජනා ක්‍රමයේ මැනුම් කටයුතු සිදු කිරීම
- ඉදිකිරීමට යෝජිත තලාව පාරිසරික උද්‍යානය සඳහා මැනුම් කටයුතු සිදු කිරීම

- IWS සමාගම විසින් ඉදිකිරීමට යෝජිත හෙලිකොප්ටර් අංගනයේ මැනුම් කටයුතු සිදු කිරීම සහ සිතියම් ගතකිරීම
- බත්තරමුල්ල ඉඩමක පිහිටීම තහවුරු කිරීම හා කොටපොල මිනින්දෝරු වාර්තාව සකස් කිරීම
- උඩවත්ත කැළය තිලංකා හෝටලයට අයත් ඉඩම මැනුම් කිරීම
- දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහජන පැමිණිලි සඳහා මැනුම් කිරීම
- ගොඩබිම සහ මුහුද ආශ්‍රිතව මත්ද්‍රව්‍ය වැටලීම්, නීති විරෝධී සංක්‍රමණ හා දේශසීමා උල්ලංඝනය කිරීම් වලදී අදාළ ආරක්ෂක හා නීති අංශවලට තීරණ ගැනීමට අවශ්‍ය නිවැරදි භූමි තොරතුරු, අවකාශීය දත්ත විශ්ලේෂණ වාර්තා සැපයීමට කටයුතු කිරීම
- කොළඹ නගර සහා සීමාව නිර්ණය කිරීම

## 9. භූ විඥාපන අංශය

### 9.1 ගුවන් මැනුම් අංශය

**කාර්යභාරය**

සිතියම්කරණය සහ සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය වන දත්ත ගුවන් ඡායාරූප භාවිත කර උකහා ගැනීම සහ LiDAR ව්‍යාපෘති ප්‍රදේශයේ 10k LiDAR දත්ත ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම

**කාර්යසාධනය**

2019 වසර තුළ ඉටුකරන ලද කාර්යයන්

| කාර්යය | **ප්‍රගතිය** |
|---|---|
| LiDAR Point Cloud සැකසීම මගින් DEM, සමෝච්ච රේඛා සහ අර්ධ ඔතෝ ඡායාරූප සකස් කිරීම | 994.23 වර්ග කි.මී. (DEM ලක්ෂ්‍ය මිලියන 249) |
| 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් යාවත්කාලීන කිරීම සඳහා 2D දත්ත උකහා ගැනීම | 4,000 වර්ග කි.මී. |
| ගුවන් ඡායාරූප නැවත මුද්‍රණය කිරීම (ඉල්ලීම් මත) | ඡායාරූප /පත්‍ර 293 |
| ගුවන්යානා මං දර්ශක සිතියමේ අංකික පරිවර්තනය | පත්‍ර 49 |
| පරිලෝකනය (Scaning) - ඍණ එලක/ධන එලක | එලක 3,007 |

### 9.2 දුරස්ථ ග්‍රහණ අංශය

**කාර්යභාරය**

සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය කිරීම සඳහා අධි විභේදන චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකරමින් 1:50,000 භූලක්ෂණාත්මත ආංකිත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ යාවත්කාලීන කරන ලද දත්ත 1:50,000 සිතියම්කරණය සඳහා සැපයීම

අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර, 1:10,000 භූලක්ෂණාත්මත ආංකිත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ යාවත්කාලීන කරන ලද දත්ත වැඩිදුර දියුණු කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති අංශය වෙත ලබාදීම

**කාර්යසාධනය**

අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකරමින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වර්ග කිලෝමීටර 15366.4 ක ප්‍රදේශයක් ආවරණය කරමින් 1:50,000 සිතියම් මාලාවේ පත්‍ර 24 ක් යාවත්කාලීන කිරීම මෙම වසරේදී සම්පූර්ණ කර ඇත.

අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකරමින් වර්ග කිලෝමීටර 3,499 ක බිම් ප්‍රදේශයක් ආවරණය කරමින් 1:10,000 සිතියම් මාලාවේ පත්‍ර 101 ක් යාවත්කාලීන කිරීම මෙම වසරේදී සම්පූර්ණ කර ඇත.

## 9.3 භූගෝලීය තොරතුරු පද්ධති අංශය

**කාර්යභාරය**

ජාතික අවශ්‍යතාවන් මෙන්ම විවිධ රාජ්‍ය ආයතන හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති නිර්මාණය කිරීම, දත්ත එක්රැස් කිරීම, පවත්වා ගැනීම, යාවත්කාලීන කිරීම සහ බෙදාහැරීම

**කාර්යසාධනය**

පසුගිය වසරවලදී අතරමැදි පියවරක් දක්වා යාවත්කාලීන කර තිබූ කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල කොටස් බැගින් හා කෑගල්ල දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි වර්ග කි.මී.4,280ක ප්‍රදේශයක්ද, 2019 වසරේම ආරම්භ කළ නුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල කොටස් බැගින් ආවරණය වන පරිදි වර්ග කි.මී.2,120ක ප්‍රදේශයක්ද වශයෙන් එකතුව වර්ග කි.මී.6400ක ප්‍රමාණයක් 1:10,000 පරිමාණයේ දත්ත පද්ධතිය යාවත්කාලීන කර අවසන් කරන ලදී.
අනුරාධපුර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල කොටස් වශයෙන් ආවරණය වන පරිදි වර්ග කි.මී.1,600ක ප්‍රමාණයක් සඳහා 1:10,000 පරිමාණයේ දත්ත පද්ධතිය දෙපාර්තමේන්තුවේ පවතින අනෙකුත් දත්ත පද්ධතීන් හා සංසන්දනාත්මකව ගලපා වැඩි දියුණු කිරීමේ පියවර හැර යාවත්කාලීන කිරීමේ අනෙකුත් පියවර සම්පූර්ණ කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම අනුව 2019 ජනාධිපතිවරණයට අදාලව ඡන්ද මධ්‍යස්ථානවල දත්ත පද්ධතිය සකසා දෙන ලදී.

රජයේ රෝහල්, පෞද්ගලික රෝහල් සහ ආයුර්වේද රෝහල් ඇතුළත් වන පරිදි දත්ත පද්ධතිය පිළියෙල කරන ලදී.

අන්තර්ජාල හරහා පරීක්ෂා කිරීමට හැකිවන ලෙස මුදා හැර ඇති ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාස සිතියම වැඩි දියුණු කරන ලදී.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි 1:50,000 පරිමාණයේ වාටිමූට්ටු රහිත (Seamless) දත්ත පද්ධතිය පිළියෙල කරන ලදී.

## 9.4 ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය ශාඛාව

**කාර්යභාරය**

අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය සැකසීමේ වැඩසටහනෙහි ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ ප්‍රතිපත්ති සැකසීමේදී අවශ්‍ය සහාය ලබා දීම.

**කාර්යසාධනය**

ශ්‍රී ලංකා ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය සකස් කිරීමේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත තාක්ෂණික හා ප්‍රතිපත්තිමය කරුණු ඇගයීම සිදුකර ඇත.

දෙපාර්තමේන්තුව පිළියෙල කරන 50k සහ 10k භූලක්ෂණාත්මක අවකාශීය දත්තවල ගුණාත්මකභාවය නිර්ණය කිරීම සඳහා අවශ්‍යවන දත්තවල ස්ථානීය නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර අදාල ඇගයීම් වාර්තාව පිළියෙළ කර ඇත.

# 10. සිතියම්කරණ අංශය

**කාර්යභාරය**

දෙපාර්තමේන්තු කාර්යභාරයේ වැදගත් අංශයක් වන සිතියම්කරණය යටතේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය භූ ලක්ෂණාත්මක සිතියම් සහ විවිධ විෂයයන්ට අදාලව තේමා සිතියම් නිෂ්පාදනය, පාරිභෝගික ඉල්ලීම අනුව සිතියම් සකස් කිරීම, සිතියම් හා සම්බන්ධ සියලු නිෂ්පාදන මුද්‍රිත හා අංකිත යන ආකාරවලින් මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම

**කාර්යසාධනය**

**භූ ලක්ෂණාත්මක සිතියම් ඇඳීම් ඒකකය මගින් නිම කරන ලද කාර්යයන්**

- 1:50,000 සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යටතේ සිතියම් 09ක් සකස්කර මුද්‍රණය සඳහා යවා ඇත. ඒවා නම්

| | | |
|---|---|---|
| 60- අත්තනගල්ල | 61-ගම්පොළ | 62-හඟුරන්කෙත |
| 67-අවිස්සාවේල්ල | 68-නුවරඑළිය | 69-බදුල්ල |
| 74-රත්නපුර | 75-බලංගොඩ | 76-හපුතලේ |

- 1:50,000 සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යටතේ සිතියම් පුනරීක්ෂණ 15ක් නිමකර ඇත.
- පාරිභෝගික අවශ්‍යතා මත 1:10,000 සිතියම් 38 ක් නිමකර ඇත.

**තේමා සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්**

- තේමා සිතියම් අංශය මගින් 2019 වසරේ නගර සිතියම් 01ක්, දිස්ත්‍රික් සිතියම් දෙවන සංස්කරණයෙහි සිතියම් 09ක් හා පළාත් සිතියම් දෙවන සංස්කරණයෙහි සිතියම් 02ක් නිම කර ඇත.
- පාසල් සිතියම් මාලාවේ දෙවන සංස්කරණයෙහි සිතියම් 04ක්ද වෙනත් තේමා සිතියම් යටතේ සිතියම් 07ක් සහ දෙපාර්තමේන්තුවේ ඉදිරිපිට ප්‍රදර්ශනය කර ඇති බිත්ති සිතියම (Wall Map) ද නිම කර ඇත.

**භූ ලක්ෂණාත්මක සිතියම් සැකසුම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්**

- 1:10,000 පරිමාණයේ පාරිභෝගික සිතියම් 80ක් මෙම අංශය මගින් නිමකර ඇත. අමතර වශයෙන් සංකේතාත්මක සිතියම් 62ක් හා රේඛාමය සිතියම් 86ක් නිම කර ඇත.

**විශේෂ සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්**

- පාරිභෝගික ඉල්ලීම මත සකස් කරනු ලබන සිතියම් විකිණීමෙන් සැලකිය යුතු ආදායමක් දෙපාර්තමේන්තුව උපයන ලද අතර 2019 වසරේදී එසේ නිම කරන ලද සිතියම් ප්‍රමාණය 466 ක් පමණ වේ.

2019 වසර තුළදී සිතියම් නිෂ්පාදනයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| 64 | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ සිවිලිම අලුත්වැඩියා කිරීම | 70,000.00 |
| 65 | | මාදම්පේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මායිම් වැට සැකසීම | 69,500.00 |
| 66 | | කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ කොටසක තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | 67,645.00 |
| 67 | | පුත්තලම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි වැසිකිළි අලුත්වැඩියා කිරීම | 60,000.00 |
| 68 | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ නිලධාරීන්ගේ විවේක කාමරය අලුත්වැඩියා කිරීම | 58,500.00 |
| 69 | | ආණමඩුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මායිම් වැට ගැසීම | 53,650.00 |
| 70 | | භූමිතික අංශයේ උපකරණ ගබඩා කිරීම සඳහා ඇලුමිනියම් බිත්ති රාක්ක සකස් කිරීම | 51,000.00 |
| 71 | උතුරු මැද පළාත | අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි නව ලේඛනාගාරයේ පළමු මහල ඉදිකිරීම | 5,517,416.36 |
| 72 | | කැබිතිගොල්ලෑව පෙරසවි කඳවුරු බිම කොන්ක්‍රීට් යෙදීම | 477,260.00 |
| 73 | | අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි ගරාජය කොන්ක්‍රීට් දැමීම සහ වහලය සැකසීම | 314,313.98 |
| 74 | | පොලොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සඳහා ගරාජයක් ඉදි කිරීම | 192,805.00 |
| 75 | | අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි වැසිකිළි අලුත්වැඩියාව | 164,670.00 |
| 76 | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය සඳහා ගබඩා කාමරයක් ඉදි කිරීම | 160,534.50 |
| 77 | | තඹුත්තේගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට ග්‍රිල් එකක් සවිකිරීම | 142,000.00 |
| 78 | | පළාත් සර්වේයර් ජනරාල් නිල නිවස සඳහා ඉන්ටලොක් ගල් ඇතිරීම | 123,140.00 |
| 79 | | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (අනුරාධපුර) නිල නිවස සඳහා ඉන්ටලොක් ගල්ඇතිරීම | 117,900.00 |
| 80 | | කැබිතිගොල්ලෑව පෙරසවි කඳවුරෙහි විදුලි පරිපථය සැකසීම | 103,549.00 |
| 81 | | පොලොන්නරුව පෙරසවි කඳවුර - අංක 49 අලුත්වැඩියාව සහ තීන්ත ආලේප කිරීම | 96,872.00 |
| 82 | | අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සඳහා සිරස් පාරාන්ධ ජනෙල් තිර යෙදීම | 79,500.00 |
| 83 | | කැකිරාව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ඉන්ටලොක් ගල් ඇතිරීම | 78,600.00 |
| 84 | | අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි ලේඛනාගාරයේ ඇතුළත කෘමි උවදුර නැති කිරීමට පිළියම් යෙදීම | 64,974.00 |
| 85 | | පොලොන්නරුව පෙරසවි කඳවුර - අංක 91 වහල අලුත්වැඩියාව | 52,200.00 |

| | | | |
|---|---|---|---|
| 86 | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ඉදිරිපස ඉන්ටර්ලොක් ගල් ඇතිරීම | 413,764.98 |
| 87 | | බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ තීන්ත ආලේප කිරීම | 138,978.00 |
| 88 | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජල ටැංකිය සඳහා GI බට වලින් ඉණිමගක් සහ වහලයක් ඉදිකිරීම | 135,000.00 |
| 89 | | තණමල්විල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයෙහි පෙරසවි කඳවුර අලුත්වැඩියාව | 132,895.00 |
| 90 | | මොනරාගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි අංක 445/9 සිතියම් තාක්ෂණ නිලධාරී නිල නිවස අලුත්වැඩියාව | 131,910.00 |
| 91 | | මොනරාගල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයෙහි ඉදිරිපස පේව්මන්ට් එක අලුත්වැඩියාව | 123,060.00 |
| 92 | | මොනරාගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි අංක 445/13 පෙරසවි කඳවුරු නිවසේ බිම අලුත්වැඩියාව | 107,230.00 |
| 93 | | බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි සිතියම් තාක්ෂණ නිලධාරි නිල නිවසේ වැට අලුත්වැඩියාව | 97,020.00 |
| 94 | | බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි අංක 41 නිල නිවස අලුත්වැඩියාව | 93,050.00 |
| 95 | | බිබිල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයෙහි මැනුම් ක්ෂේත්‍ර සහායක පෙරසවි කඳවුර අලුත්වැඩියාව | 90,410.00 |
| 96 | | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (මොනරාගල) නිල නිවසේ දොරවල් සැකසීම | 56,406.34 |
| 97 | සබරගමුව පළාත | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය සඳහා ගරාජයක් ඉදි කිරීම | 378,008.87 |
| 98 | | රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි ගරාජය පුළුල් කිරීම | 274,624.41 |
| 99 | | කෑගල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියාව | 79,375.00 |
| 100 | | රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙහි අනුරේඛන නිකුත් කිරීමේ අංශය සඳහා නව කවුළුවක් සැකසීම, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කාර්යාල කාමරය සහ බිම්සවිය කාර්යාලය වායුසමීකරණය කිරීම සඳහා ඇළුමිනියම් දොරවල් 3ක් සහ ඊට අවශ්‍ය අනෙකුත් උපාංග සැකසීම | 75,400.00 |
| 101 | | ඇඹිලිපිටිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයෙහි නව ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනීම | 56,359.80 |
| 102 | | ගොරොක්ගොඩ කඳවුර අලුත්වැඩියාව | 51,205.00 |

3.2 රු. 50,000.00 ඉක්මවු වාහන අලුත්වැඩියාවන්

| | නඩත්තු කටයුතු කළ වාහන ගණන | වැය වූ මුළු මුදල රු. |
|---|---|---|
| බස්නාහිර පළාත | 19 | 1,195,816.90 |
| මධ්‍යම පළාත | 20 | 1,467,340.22 |
| දකුණු පළාත | 22 | 3,148,835.08 |
| උතුරු පළාත | 14 | 2,271,326.82 |
| නැගෙනහිර පළාත | 06 | 1,047,913.87 |
| වයඹ පළාත | 10 | 1,874,564.69 |
| උතුරු මැද පළාත | 11 | 1,104,324.86 |
| ඌව පළාත | 13 | 1,047,473.12 |
| සබරගමුව පළාත | 12 | 1,769,753.12 |
| එකතුව | 127 | 14,927,348.68 |

## 4. සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්

| පළාත | පුහුණු වැඩසටහන | සහභාගීවූ නිලධාරී කාණ්ඩය සහ ප්‍රමාණය |
|---|---|---|
| බස්නාහිර පළාත | කැඩැස්තර සිතියම් ප්‍රදේශයක සිදු කරන පසු කාලීන මැනුම් හා නව ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | ලියාපදිංචි බලයලත් මිනින්දෝරු |
| | පිඹුරු පරීක්ෂාව සඳහා CAD Tools, QGIS Plugins, "SL Cadaster" & TLDMS නව සංස්කරණ දැනුවත් කිරීමේ වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු |
| දකුණු පළාත | භූමිතික මැනුම් සිදුකිරීම සම්බන්ධව පුහුණු වැඩසටහන | මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු -35 |
| | පිඹුරු පරීක්ෂාව සඳහා CAD Tools "SL Cadaster" & TLDMS නව සංස්කරණ දැනුවත් කිරීමේ වැඩමුළුව | මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු - 40 |
| වයඹ පළාත | උසාවි මැනුම් සහ නව ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ සහ ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | පළාත් සර්වේයර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු, කාර්මික හා පරිපාලන නිලධාරී, සිතියම් තාක්ෂණ නිලධාරී - 40 |
| | ඵලදායිතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | පළාත් සර්වේයර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු, කාර්මික හා පරිපාලන නිලධාරී, සිතියම් තාක්ෂණ නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරී, මැනුම් ක්ෂේත්‍ර සහායක, රියැදුරු, දෙපාර්තමේන්තු සහායක - 76 |
| | ආයතන සංග්‍රහය, කාර්යාල ක්‍රම සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | පළාත් සර්වේයර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී, කාර්මික හා පරිපාලන නිලධාරී, සිතියම් තාක්ෂණ නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරී -70 |
| | උසාවි මැනුම්, අංකිත දත්ත සහ පිඹුරු සංශෝධන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | පළාත් සර්වේයර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු, කාර්මික හා පරිපාලන නිලධාරී, සිතියම් තාක්ෂණ නිලධාරී - 76 |
| උතුරු මැද පළාත | ඵලදායිතාවය සහ S5 සංකල්පය පිළිබඳ වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මිනින්දෝරු අධිකාරී ,රජයේ මිනින්දෝරු,මැනුම් ක්ෂේත්‍ර සහායක, කළමනාකරණ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරී,කාර්යාල කාර්ය සහායක, දෙපාර්තමේන්තු සහායක - 285 |
| සබරගමුව පළාත | පිඹුරු පරීක්ෂාව සඳහා CAD Tools ,QGIS Plugins, "SL Cadaster" & TLDMS නව සංස්කරණ දැනුවත් කිරීමේ වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මිනින්දෝරු අධිකාරී, රජයේ මිනින්දෝරු -115 |

## මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් ඉටුකළ කාර්යයන්

**කාර්යසාධනය**

1. ආයතනය වසර තුළ පවත්වන ලද පාඨමාලා

1.1 වසර තුළ පවත්වන ලද නිශ්චිත පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | කාලය | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය/අවසන් කිරීමට නියමිත දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව - ( BDC / 15 ) | වසර 4 (අධ්‍යයන) | 2018.01.08 | 2022.01.08 | 13 |
| 2 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව සඳහා වන උසස් ඩිප්ලෝමා පාඨමාලාව ( SLTS / 08 ) | වසර 2 (අධ්‍යයන) | 2019.04.22 | 2021.04.22 | 49 |

1.2 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වසර තුළ පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | දින ගණන | පැවැත්වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සිගාස් පුහුණු වැඩසටහන | 1 | 2019.01.22 | 56 |
| 2 | මිනින්දෝරු අධිකාරී වරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන ( 1 වන කණ්ඩායම ) | 2 | 2019.02.21 - 2019.02.22 | 50 |
| 3 | ඌව පළාතේ මිනින්දෝරු අධිකාරීවරුන් සහ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ පාඨමාලාව | 1 | 2019.02.07 | 45 |
| 4 | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන | 2 | 2019.03.21 - 2019.03.22 | 89 |
| 5 | මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (2 වන කණ්ඩායම) | 2 | 2019.05.10 - 2019.05.11 | 67 |
| 6 | කාර්මික හා පරිපාලන නිලධාරීන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන | 3 | 2019.10.21- 2019.10.23 | 37 |
| 7 | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන | 5 | 2019.11.24- 2019.11.29 | 39 |
| 8 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (ගම්පහ දිස්ත්‍රික්කය) | 1 | 2019.12.05 | 33 |
| 9 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (කෑගල්ල දිස්ත්‍රික්කය) | 1 | 2019.12.06 | 27 |
| 10 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (රත්නපුර දිස්ත්‍රික්කය) | 1 | 2019.12.09 | 55 |
| 11 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (ඌව පළාත සහ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ) | 1 | 2019.12.10 | 79 |
| 12 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන ( මාතර දිස්ත්‍රික්කය) | 1 | 2019.12.16 | 46 |
| 13 | SL Cadaster සහ TLDB නව සංස්කරණය පිළිබඳව රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත් වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (හම්බන්තොට දිස්ත්‍රික්කය) | 1 | 2019.12.17 | 46 |

1.3 වෙනත් ආයතන සඳහා වසර තුළ පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | දින ගණන | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය | ආයතනය |
|---|---|---|---|---|---|
| 1 | පුහුණු වැඩමුළුව | 3 | 30 | 2019.01.21-2019.01.23 | ආදායම් දෙපාර්තමේන්තුව (ඌව/සබරගමුව) |
| 2 | පුහුණු වැඩමුළුව | 1 | 73 | 2019.01.25 | ස්වේච්ඡා හමුදා පුහුණු පාසල - දියතලාව |
| 3 | අධ්‍යාපනික චාරිකාව | 1 | 16 | 2019.01.25 | ශ්‍රී ලංකා ගුවන් හමුදා සටන් පුහුණු පාසල - දියතලාව |
| 4 | දේශනය | 1 | 45 | 2019.02.07 | ඌව පළාත් රජයේ මිනින්දෝරු සංගමය |
| 5 | පුහුණු වැඩමුළුව | 3 | 30 | 2019.02.13-2019.02.15 | ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය |
| 6 | පුහුණු වැඩමුළුව | 3 | 16 | 2019.02.26-2019.02.28 | ආදායම් දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත්1 වන කණ්ඩායම |
| 7 | අධ්‍යාපනික චාරිකාව සහ දේශනය | 1 | 13 | 2019.02.15 | ශ්‍රී ලංකා නාවික හමුදා විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය |
| 8 | අධ්‍යාපනික චාරිකාව සහ දේශනය | 1 | 48 | 2019.02.18 | කොමාන්ඩෝ රෙජිමේන්තුව - ඌව කුඩාඔය |
| 9 | අධ්‍යාපනික චාරිකාව | 1 | 41 | 2019.02.18 | දේවි බාලිකා විද්‍යාලය-කොළඹ 08 |
| 10 | අධ්‍යාපනික චාරිකාව | 1 | 48 | 2019.02.25 | ශ්‍රී ලකා ගුවන් හමුදාව - කැඩෙට් නිලධාරීන් |
| 11 | අධ්‍යාපනික චාරිකාව | 1 | 373 | 2019.03.07 | ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය |
| 12 | පුහුණු වැඩමුළුව | 3 | 13 | 2019.03.13-2019.03.15 | ආදායම් දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත් 2 වන කණ්ඩායම |
| 13 | පුහුණු වැඩමුළුව | 3 | 47 | 2019.03.27 - 2019.03.29 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - 1 වන කණ්ඩායම |
| 14 | අධ්‍යාපනික චාරිකාව සහ දේශනය | 1 | 23 | 2019.03.05 | රාජ්‍ය දැව සංස්ථාව |
| 15 | අධ්‍යාපනික චාරිකාව සහ දේශනය | 1 | 55 | 2019.03.05 | වන විද්‍යා ආයතනය - සඳතැන්න |
| 16 | අධ්‍යාපනික චාරිකාව | 1 | 36 | 2019.04.05 | ශ්‍රී ලංකා නාවික හමුදා විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය |
| 17 | අධ්‍යාපනික චාරිකාව | 1 | 69 | 2019.04.05 | ශ්‍රී ලංකා නාවික හමුදාව (මූලස්ථානය) |
| 18 | අධ්‍යාපනික චාරිකාව | 1 | 27 | 2019.05.10 | ශ්‍රී ලංකා නාවික හමුදා විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය |
| 19 | අධ්‍යාපනික චාරිකාව | 1 | 68 | 2019.05.10 | ශ්‍රී ලංකා නාවික හමුදාව (මූලස්ථානය) |
| 20 | අධ්‍යාපනික චාරිකාව | 1 | 22 | 2019.05.22 | ශ්‍රී ලංකා යුද හමුදා කාලතුවක්කු පුහුණු පාසල - මින්නේරිය |
| 21 | අධ්‍යාපනික චාරිකාව | 1 | 23 | 2019.05.31 | ශ්‍රී ලංකා නාවික හමුදාව (මූලස්ථානය) |
| 22 | පුහුණු වැඩමුළුව | 5 | 39 | 2019.06.10 - 2019.06.14 | උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල (01 වන කණ්ඩායම) |
| 23 | අධ්‍යාපනික චාරිකාව | 1 | 63 | 2019.06.14 | SLNS Shiksha, මැදවච්චිය |
| 24 | අධ්‍යාපනික චාරිකාව | 1 | 94 | 2019.06.28 | සබරගමුව විශ්වවිද්‍යාලය - දූරස්ථ ගෝචර සහ භූගෝලීය තොරතුරු පද්ධති දෙපාර්තමේන්තුව |
| 25 | අධ්‍යාපනික චාරිකාව | 1 | 38 | 2019.07.26 | ඇල්ලේගම මහා විද්‍යාලය - දියතලාව |
| 26 | අධ්‍යාපනික චාරිකාව | 1 | 33 | 2019.08.06 | ශ්‍රී ලංකා ගුවන් හමුදා සටන් පුහුණු පාසල - දියතලාව |
| 27 | අධ්‍යාපනික චාරිකාව | 1 | 52 | 2019.08.09 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය- දක්ෂිණ පීඨය |
| 28 | අධ්‍යාපනික චාරිකාව | 1 | 35 | 2019.08.22 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය |
| 29 | පුහුණු වැඩමුළුව | 5 | 37 | 2019.07.29 - 2019.08.02 | උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල (02 වන කණ්ඩායම) |
| 30 | පුහුණු වැඩමුළුව | 1 | 51 | 2019.08.22 | කැලණිය විශ්ව විද්‍යාලය - භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | අධ්‍යාපනික චාරිකාව | 1 | 12 | 2019.09.08 | ශ්‍රී ලංකා නාවික හමුදාව - ජලමාන මැනුම් පාසල |
| 32 | අධ්‍යාපනික චාරිකාව | 1 | 30 | 2019.09.19 | ස්වේච්ඡා හමුදා පුහුණු පාසල - දියතලාව |
| 33 | අධ්‍යාපනික චාරිකාව | 1 | 85 | 2019.10.21 | සියනෑ ජාතික අධ්‍යාපනික විද්‍යාපීඨය - පත්තලගෙදර |
| 34 | අධ්‍යාපනික චාරිකාව | 1 | 40 | 2019.10.28 | බටේමුල්ල ජාතික පාසල - ඉමදූව |
| 35 | අධ්‍යාපනික චාරිකාව | 1 | 40 | 2019.11.20 | RSF Wing ශ්‍රී ලංකා ගුවන් හමුදාව-මොරවැව |
| 36 | අධ්‍යාපනික චාරිකාව | 1 | 25 | 2019.11.26 | ශ්‍රී ලංකා නාවික හමුදාව - සුළු නිලධාරී (බුද්ධි අංශය) |
| 37 | අධ්‍යාපනික චාරිකාව | 1 | 67 | 2019.11.29 | SLNS Shiksha - පූනෑව |
| 38 | අධ්‍යාපනික චාරිකාව | 1 | 20 | 2019.12.16 | කාලතුවක්කු පාසල - මින්නේරිය |

| 2019 වසරේ සිදු කරන ලද කෙටි කාලීන පාඨමාලාවන් වල සාරාංශය | | | |
|---|---|---|---|
| එක් දින වැඩමුළු | දෙදින වැඩමුළු | තෙදින වැඩමුළු | පස් දින හා සය දින වැඩමුළු |
| 30 | 1 | 5 | 2 |

2. වසර තුළදී ඉටු කරන ලද රු. 50,000.00 ට වැඩි තැනීම් හා අලුත්වැඩියාවන්

| | |
|---|---|
| මහවැලි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 1,465,243.58 |
| සංචාරක බංගලාව - 03, නිවාඩු නිකේතනය - 41 අලුත්වැඩියා කිරීම | 941,872.16 |
| නිවාඩු නිකේතනය 41වෙත මාර්ගය නැවත සැකසීම | 402,154.48 |
| අංක 22,23,24 ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම | 374,282.00 |
| සංචාරක බංගලාව 02 මාර්ගය ඉදිකිරීම -2 අදියර | 367,674.85 |
| නො.51 නිවස අලුත්වැඩියා කිරීම | 345,235.68 |
| සංචාරක බංගලාව - 01 වහලය අලුත්වැඩියා කිරීම | 248,600.65 |

3. වසර තුළදී රු. 1,099,559.12ක මුදලක් වැයකර වාහන 8ක රු.50,000.00 ඉක්මවූ අළුත්වැඩියාවන් සිදුකර ඇත.

4. වෙනත් විශේෂ කටයුතු

**1.** මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ 50 වන සංවත්සර සැමරුම සහ අධ්‍යාපන ප්‍රදර්ශනය

1969 දී පිහිටුවනලද මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය (මැසිආ) 2019 වසර වන විට වසර පනහක ප්‍රශංසනීය සේවය සාඩම්බරයෙන් සම්පූර්ණ කරන ලදී. "මිනින්දෝරු මව්-නිවහන" ලෙස පිළිගනු ලබන මැසිආ ලොව පුරා සේවය කරන මිනින්දෝරු වෘත්තිකයන් දහස් ගණනක් බිහිකර ඇත. අතීත සේවකයින්ගේ ප්‍රශංසනීය සේවාවන්ට ගෞරව දැක්වීමේ උත්කර්ෂවත් සම්මාන ප්‍රදානෝත්සවයක් ද පවත්වමින්, 2019 සැප්තැම්බර් 11 සහ 12 යන දෙදින තුළ මැසිආ සිය 50 වන සංවත්සරය සමරනු ලැබීය. මිනින්දෝරු ඉතිහාසය සහ වෘත්තියේ තාක්ෂණික අභිවර්ධනය පෙන්නුම් කරමින් දැවැන්ත අධ්‍යාපන ප්‍රදර්ශනයක් ද මෙම දෙදින තුළ සංවිධානය කර තිබුණි. මැනුම් හා සිතියම්කරණයේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි මැනුම් හා සිතියම්කරණ ප්‍රදර්ශනය පවත්වන ලද අතර ආයතනයේ කථිකාචාර්යවරුන් සහ උපාධි අපේක්ෂකයින් විසින් සෑම අයිතමයක් පිළිබඳවම විස්තර කථන ඉදිරිපත් කරන ලදී. මිනින්දෝරු වෘත්තිය හා ඓතිහාසික අංශ පිළිබඳව දැනුමක් ලබා ගැනීම සඳහා අවට පාසල්වල පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත්, මැසිආ අවට ආරක්ෂක අංශවලට සහ මහජනතාවටත් මෙය මහඟු අවස්ථාවක් විය. මෙම දෙදින තුළ ප්‍රදර්ශනය සඳහා 5000 කට අධික සහභාගිත්වයක් ලැබී ඇති බව පෙනී යයි.

ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා, ගරු නියෝජ්‍ය අමාත්‍ය එඩ්වර්ඩ් ගුණසේකර මහතා, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා, සර්වේයර් ජනරාල් එස්.එම්.පී.පී. සංගක්කාර මහතා සහ තවත් ආරාධිතයින් කිහිප දෙනෙක් මෙම අවස්ථාවට සහභාගි වූහ. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සංගීත කවය විසින් නිර්මාණය කරන ලද මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ගීතය එම අවස්ථාවේදීම එළිදක්වන ලදී. මැසිආ හි අනාගතය වෙනුවෙන් විශිෂ්ට සේවයක් කළ ආයතනයේ වත්මන් හා විශ්‍රාමික සේවකයින්ගේ සේවය අගයනු වස් සම්මාන ප්‍රදානෝත්සවයක් පැවැත්විණි. සමාරම්භක උත්සවය සහ අධ්‍යාපන ප්‍රදර්ශනයට සමගාමීව රජයේ මිනින්දෝරුවන්ගේ ක්‍රීඩා සමාජයේ (GSSC) ව්‍යායාම ශාලාව ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් විවෘත කරන ලදී.



සමාරම්භක උත්සවයේදී ආරාධිත අමුත්තන්

*ඡායාරූපයේ සිටින අය; වමේ සිට දකුණට*

පී.ඒ.එන්. ද සිල්වා මහතා-අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර), එස්.ඩී.පී.ජේ. දාම්පෙගම මහතා-අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම), ඩබ්.එච්. කරුණාරත්න මහතා-ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, ගයන්ත කරුණාතිලක මැතිතුමා-ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, එඩ්වර්ඩ් ගුණසේකර මැතිතුමා-ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍ය, එස්.එම්.පී.පී. සංගක්කාර මහතා-සර්වේයර් ජනරාල්, ඒ. දිසානායක මහතා- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු)/අධ්‍යක්ෂ, මැ.සි.ආ.



සම්භාවනීය අමුත්තන් ප්‍රදර්ශනය නරඹමින්



පාසැල් සිසුන් ප්‍රදර්ශනය නරඹමින්

**2.** බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලය (BUCEA) සමඟ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා පදනම

බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලය සමඟ අන්තර්ජාතික සහයෝගීතාව සඳහා පදනමක් පිහිටුවීම සඳහා 2019 වර්ෂයේදී මැනුම් හා සිතියම්කරණ ආයතනයට මහඟු අවස්ථාවක් ලැබුණි. ශ්‍රී ලංකා සර්වේයර් ජනරාල් එස්.එම්.පී.පී.සංගක්කාර මහතා කරන ලද ආරාධනයකට ප්‍රතිචාර වශයෙන්, බීජිංහි සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලයේ විද්වත් කණ්ඩායමක් අනාගත අධ්‍යයන සහයෝගීතාවය අරමුණු කර ගනිමින් 2019 ජුනි 24 සහ 26 දිනවල සර්වේයර් ජනරාල් කාර්යාලයට සහ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත පැමිණියේය.

BUCEA හි සභාපතිගේ නායකත්වයෙන් යුත් බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලයේ විද්වත් නියෝජිත පිරිස පළමුව 2019 ජුනි 24 වන දින සර්වේයර් ජනරාල් කාර්යාලයට පැමිණ තාක්ෂණික සහයෝගීතාව සඳහා සර්වේයර් ජනරාල් සමඟ අවබෝධතා ගිවිසුමට (MOU) අත්සන් තැබීය.



සර්වේයර් ජනරාල් සහ BUCEA හි සභාපති අත්සන් කළ අවබෝධතා ගිවිසුම සමඟ



අවබෝධතා ගිවිසුම සංකේතවත් කරමින් සමරු හුවමාරුව



අවබෝධතා ගිවිසුමෙන් පසු සමූහ ඡායාරූපය

*ඡායාරූපයේ සිටින අය; වමේ සිට දකුණට*

හී හුවාං මහතා-මහාචාර්ය, මැනුම් සහ නාගරික අවකාශ තොරතුරු පීඨය, මින්ගි ඩියූ මහතා-පීඨාධිපති, මැනුම් සහ නාගරික අවකාශ තොරතුරු පීඨය, නෙල්සන් විජේනායක මහතා-නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (අධ්‍යයන), ඒ. දිසානායක මහතා- ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු)/අධ්‍යක්ෂ, මැ.සි.ආ., එස්.එම්.පී.පී.සංගක්කාර මහතා-සර්වේයර් ජනරාල්, වයිපින් ලී මහතා-සභාපති - බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලය, ජී ජියැන්ග් මහත්මිය-මහාචාර්ය - මැනුම් සහ නාගරික අවකාශ තොරතුරු පීඨය, යුෆැං ලියු මහත්මිය-සාමාන්‍යාධිකාරී - බීජිං PieSat ආයතනය

ඉන් පසුව එම විද්වත් නියෝජිත පිරිස අනාගත සහයෝගීතාව පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා 2019 ජූනි මස 26 වන දින මැසිආ හි අධ්‍යක්ෂ/ ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් ඒ.දිසානායක මහතා සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය මුණගැසුනි. අධ්‍යයන හා ආයතනික යටිතල පහසුකම් සහ අනාගත සහයෝගීතාව සඳහා දියුණු කළ හැකි මාර්ග දක්වමින් ආයතන දෙක විසින්ම කරන ලද ඉදිරිපත්කිරීම් මගින් විධිමත් සාකච්ඡාවක් පවත්වන ලදී. පසුව, මැසිආ ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිරිපස සිට ගන්නා ලද ඡායාරූපයකින් මෙම සංචාරය සංකේතවත් කරන ලදී.



බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලයේ විද්වත් නියෝජිත පිරිස
මැනුම් හා සිතියම්කරණ ආයතනයේ සංචාරය කිරීම

3. චන්ද්‍රිකා ඡායාරූප සැකසුම් පිළිබඳ තාක්ෂණික වැඩමුළුව

බීජිං සිවිල් ඉංජිනේරු හා ගෘහ නිර්මාණ විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අදාලව, ශක්‍යතා වර්ධන වැඩසටහනක් ලෙස Satellite Image Processing මෘදුකාංගය පිළිබඳ වැඩමුළුවක් බීජිං PieSat Information Technology Co.Ltd. විසින් 2019 දෙසැම්බර් 5 සහ 6 යන දිනවල සර්වේයර් ජනරාල් කාර්යාලයේ දුරස්ථ ග්‍රහණ අංශයේදී පවත්වන ලදී. සියලුම දුරස්ථ ග්‍රහණ තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය එම පුහුණු සැසිවාරය සඳහා සහභාගි විය. එහිදී Satellite Image Processing මෘදුකාංගය, PIESAT පුහුණු මෘදුකාංගය ලෙස හඳුන්වා දුන් අතර මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය සහ සර්වේයර් ජනරාල් කාර්යාලය වෙත පුහුණු බලපත්‍ර ලබා දෙන ලදී.




වැඩමුළුවේ තාක්ෂණික හා අධ්‍යයන කාර්ය මණ්ඩලය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඒජීඑල්/බී/එස්ඩී/02/<br>2019/11 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020 ජුනි 30 දින |

සර්වේයර් ජනරාල්

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාත්මක මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1.6.1 (අ) | රු.මිලියන 13 ක වියදමින් පොලොන්නරුව මිනින්දෝරු කාර්යාලයේ ඉදිකිරීම කටයුතු 2017 වර්ෂයේ නිමකර ඇතත්, 2017, 2018 වර්ෂවල හෝ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ද හෙළිදරවු කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම නිමකර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |
| (ii) | 1.6.1 (ආ) | 2017 වර්ෂයේදී ඉඩම හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් ඉඩම බැංකු ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබුණු රු.මිලියන 37.83 ක ලැප්ටොප් පරිගණක, ඔප්ටිකල් කේබල් හා පිඹුරු පරිලෝකනය යන වත්කම් 2017, 2018 වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ද හෙළිදරවු කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.5 ඡේදය ප්‍රකාරව වෙනත් ආයතනවලින් ලබාදුන් ප්‍රතිපාදන මත මිලදී ගෙන ඇති වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | 1.6.2 (ඇ) | මධ්‍යම, උතුරුමැද, නැගෙනහිර හා වයඹ යන පළාත්වල දෙපාර්තමේන්තුවට අයිති හිස් ඉඩම් හෙක්ටයාර් 1.3139 ක්ද, අනුරාධපුරය සහ ගලේවෙල යන ස්ථානවල ගොඩනැගිලි ඉදිකළ ඉඩම් 02 ක්ද, බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිල නිවස සහ අනුරාධපුරය පෙරසවි කඳවුර ඇතුළු දකුණු පළාතේ තවත් ගොඩනැගිලි 02 ක්ද තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කළ යුතු වීම. |
| (iv) | 1.6.3 (අ) | රු.මිලියන 6,693 ක් ලෙස ගිණුම්ගතකර ඇති ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය හා නීත්‍යානුකූලභාවය තහවුරු කිරීමට ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (v) | 1.6.4 | දෙපාර්තමේන්තුව විසින් මුදල් කටයුතුභාර නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (vi) | 2.1 (ඇ) | දෙපාර්තමේන්තුව විසින් සිතියම් සහ අංකිත දත්ත යාවත්කාලීන කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා යාවත්කාලීන නොවූ සිතියම් සහ අංකිත දත්ත අලෙවි කිරීමෙන් ජනතාවට ඉඩම් පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, මේ නිසා සිතියම් සහ අංකිත දත්ත විකුණුම් ආදායම ඉහළ නංවා ගැනීමට නොහැකි වී තිබුණි. | ජනතාවට යාවත්කාලීන භූමි තොරතුරු ලබා දිය යුතු වීම හා ආදායම් මාර්ග වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (vii) | 3.1.1 | ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා වීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර; ගුණාත්මක භූමි තොරතුරු සැපයීම ප්‍රධාන මෙහෙවර වේ. පසුගිය දශකයකට අධික කාලය තුළ ශ්‍රී ලංකා භූමියෙහි සිදු වූ වෙනස්වීම් යාවත්කාලීන කළ සිතියම් ප්‍රකාශයට පත් කිරීම දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ දැක්මට හා මෙහෙවරට අනුකූලව ප්‍රායෝගිකව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | විසින් සිදුකළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය 2008 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර ප්‍රකාශයට පත්කර නොතිබුණි. | |
| (viii) | 3.3 (අ) | දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නිල නිවාස 08 ක් හා ඌව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ තාක්ෂණික නිලධාරි නිල නිවස සමාලෝචිත වර්ෂය අවසානයටද අභාවිතව පැවතුණි. | දේපළ ආරක්ෂා කර ගැනීමටත්, උපයෝජනයටත්, පියවර ගත යුතු වීම. |
| (ix) | 3.3. (ආ) | බිම් සවිය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිලි ඉඩම් අමාත්‍යාංශයෙන් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පැවතුණි. | වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ලබාදුන් වත්කම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (x) | 3.4. | දෙපාර්තමේන්තුවේ මුදල් භාර සරප් නිලධාරීන් 37 දෙනෙකකු සඳහා මු.රෙ. 880 ප්‍රකාරව ඇප තබා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඇප ලබා ගත යුතු වීම. |
| (xi) | 3.5 | වර්ෂ 01 සිට වර්ෂ 30 කට අධික කාල පරාසයක් තුළ අවස්ථා 47 කදී වාහන හා අනෙකුත් වත්කම්වලට සිදුවී ඇති රු.මිලියන 6.5 ක අලාභහානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.103 පරිදි පාඩු හා හානි සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර අලාභ අයකර ගත යුතු වීම. |
| (xii) | 3.6 (ඇ) | 2002 අංක 17 දරන මැනුම් පනතේ 08 වන ඡේදය අනුව සර්වේයර් ජනරාල්වරයා විසින් මුළු ශ්‍රී ලංකාවම ක්‍රම ක්‍රමයෙන් ආවරණය වන පරිදි සංඛ්‍යාංක හෝ වෙනත් ආකාරයෙන් භූ ගෝලීය දත්ත පාදකයක් සහ කැඩැස්තර දත්ත පාදකයක් පවත්වා ගෙනයාමට භූ ගෝලීය තොරතුරු පද්ධතියට ඇතුළත් කර තිබූ වර්ග | යාවත්කාලීන දත්ත සහ තොරතුරු ජනතාවට ලබා දීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කිලෝමීටර් 20760 ක් සඳහා වන දත්ත 1982 - 2007 අතර කාලපරිච්ඡේදයට අයත් පැරණි දත්ත බැවින් එමගින් ජනතාවට යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ අවස්ථාව මගහැරී තිබුණි. | |
| (xiii) | 3.6 (ඉ) | දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකුගේ මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක් ලෙස වර්ෂ 37 කටත් පෙර පිහිටුවාගත් සම්මතය මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. | මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව සමාලෝචනය කළ යුතු වීම. |
| (xiv) | 3.6 (උ) | රු.මිලියන 9,622 කට තක්සේරුකර තිබුණු වාහන 327 ක් හා යන්ත්‍ර උපකරණ තොගය තක්සේරු කිරීමේදී වෘත්තීය තක්සේරුකරුවන්ගේ සේවය ලබාගෙන නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීමේදී රජයේ වෘත්තීය තක්සේරුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (xv) | 4. (ඇ) | කාර්මික හා පරිපාලන නිලධාරීන් විසින් සිතියම් තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කළ යුතු වුවද, මිනින්දෝරු සේවයේ නිලධාරීන් විසින් සිතියම් තාක්ෂණ නිලධාරීන් 61 දෙනෙකු අධීක්ෂණය කර තිබුණි. | කාර්මික හා පරිපාලන නිලධාරීන් විසින් සිතියම් තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කළ යුතු වීම. |

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් ලැබීම

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මුළු ආදායම් ලැබීම් ලෙස රු.432,574,895 ක ආදායමක් දක්වා ඇතත්, පරිගණක මුද්‍රිත සටහන අනුව දක්වා තිබුණු ආදායම රු.432,271,585 කි. මේ අනුව රු.303,310 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස පැහැදිලි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් විය.

#### 1.6.1.2 තැන්පතු ගිණුම් ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-4) තැන්පත් ගිණුම්වල එකතුව රු.11,141,292 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එදිනට ශේෂය රු.11,094,223 ක් වූයෙන් රු.47,069 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස පැහැදිලි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලෙජර් ගිණුම් සම්බන්ධයෙන් තැන්පතු කාල විශ්ලේෂණය සිදු කිරීමේදී වර්ෂ 05 - 07 අතර, රු.81,204 ක්ද, වර්ෂ 2 - 4 අතර, රු.2,814,214 ක්ද වශයෙන් දීර්ඝ කාලීන නිරවුල් නොකළ තැන්පතු ශේෂ පවතින බව නිරීක්ෂණය විය. මේවා නිරවුල් කිරීමට හෝ මු.රෙ 571(3) ප්‍රකාරව ක්‍රියාකර රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශය

#### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැදවච්චිය, ඇඹිලිපිටිය, කරුන්කාඩු හා මාදම්පේ යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ ගිරිතලේ නිල නිවස යන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම වෙමින් පැවතුණු අතර, එදිනට රු.9,764,046 ක් වූ නොනිමි වැඩ ශේෂය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ යටතේ පෙන්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අදාළ ඉදිකිරීම්වල එකතුව රු.83,236,331 ක් වුවද, එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන

වත්කම් ලෙස දක්වා නොතිබුණු අතර, පෙර වර්ෂයේ නොනිම් වැඩ වශයෙන් දක්වා ඇති ඉහත නොනිම් වැඩ ශේෂයම සමාලෝචිත වර්ෂය අවසානයටද දක්වා තිබුණි.

(ආ) බදුල්ල සහ ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේදී ඉදි වෙමින් පැවතුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට එම වත්කම්වල රු.36,770,240 ක් වූ නොනිම් වැඩ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෙළිදරවු කර නොතිබුණි.

### 1.6.2.2 වත්කම් අපහරණය නොකිරීම.

දෙපාර්තමේන්තුවට අයත් වසර 10 කට ආසන්න කාලයක සිට ධාවනයෙන් ඉවත් කර ඇති අංක 58-6932 දරන කැබ් රථය සමාලෝචිත වර්ෂයේදී රත්මලාන කාර්මික විද්‍යාලයට ලබා දීමට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අනුමැතිය ලබා දී ඇතත්, විගණන දිනය වන 2020 ජුනි 30 දින වන විටත්, අදාළ වාහනය නිෂ්කාර්යව දෙපාර්තමේන්තු භූමියේ ගාල් කර තිබුණි.

### 1.6.2.3 අභාවිත හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේදීද රු.70,110,000 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි අභාවිතව පැවතුණි.

### 1.6.2.4 අග්‍රිම ගිණුමේ ශේෂය

ගිණුම සමඟ ඉදිරිපත් කළ අග්‍රිම ගිණුම (ඒසීඒ-3) පරිදි අග්‍රිම ලැබීම්වල එකතුව සහ අග්‍රිම ගෙවීම්වල එකතුව ලෙස පිළිවෙලින් රු.3,947,245,069 ක් හා රු.3,931,291,397 ක් පෙන්වා තිබුණි. ඒ අනුව මෙම ශේෂ අතර වෙනස රු.15,953,672 ක් විය යුතු වුවද, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.9,218,360 ක් වූයෙන් රු.6,735,312 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස වර්ෂ අවසාන මුදල් ශේෂයවන රු.3,068 සමඟ එකතුකර මාර්ගස්ථ මුදල් ලෙස දක්වා සඳොස් ලෙස අක්මුදල් ගැලපුම් ගිණුම තුළනය කර තිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ඒසීඒ-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එකතුව රු.5,689,157,500 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ ඔප්පු සමාලෝචිත වර්ෂයේදීද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිසි ලෙස කරුණු සොයා බැලීමකින් පසුව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සහ නියමිත කාල වකවානුව තුළදී නිශ්චිත කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 22 ට අදාළව එකතුව රු.20,015,778 ක ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 17 කට අදාළව එකතුව රු.140,265,925 ක ඉතිරිවීම් පැවතුණි. මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අක්මුදල් ලබා නොදීම මෙම ඉතිරිවීම්වලට හේතු වූ බව ගණන්දීමේ නිලධාරී විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ආ) වැය විෂයයන් තුනක් සඳහා ලබාදුන් එකතුව රු.68,500,000 ක පරිපූරක ඇස්තමේන්තුවලින් රු.55,583,862 ක මුදලක් හෙවත් සියයට 81 ක් ඉතිරිකර තිබුණු අතර, 288-02-02-1401 වැය විෂයයට ලබා දුන් රු.2,000,000 ක සම්පූර්ණ පරිපූරක ඇස්තමේන්තුවම ඉතිරිකර තිබුණි.

(ඇ) වැය විෂයයන් 09 කට එකතුව රු.65,100,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වලින් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකරගෙන තිබුණු අතර, මෙසේ මාරුකරගත් ප්‍රතිපාදන වලින් එකතුව රු.33,740,494 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිකර තිබුණි. මෙම මාරුකරගත් ප්‍රතිපාදනවල ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 27 සිට සියයට 100 දක්වා පරාසයක පැවැති අතර, 288-02-02-1301 වැය විෂයයට මෙසේ මාරුකරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි.

(ඈ) 288-02-02-2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්) වැය විෂයය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර, මු.රෙ.66 මාරු පත්‍රය මඟින් රු.50,000,000 ක් වෙනත් ප්‍රාග්ධන වැය විෂයයකින් මාරුකරගෙන තිබුණු අතර, එම මාරුකරගත් ප්‍රතිපාදන වලින් රු.25,211,170 ක් හෙවත් සියයට 50 ක් ඉතිරි කර තිබුණි.

2.2 පාඩු හා හානි

1989 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 29 කට ආසන්න කාල පරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ වත්කම් වර්ග 21 කට සිදු වූ රු.2,544,758 ක අලාභ හානි සහ 1998 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාහන 28 කට සිදු වූ රු.4,251,626 ක අලාභ හානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට විගණන දිනය වන 2020 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

2018 අගෝස්තු 01 දිනැති අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව ගිණුම් සමග ඉදිරිපත් කළ යුතු අස්වීත්වයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය සහ කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ආර්.එම්.රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට
ආර්. එම්. රත්නායක
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය